முஸ்லிம் சமய பண்பாட்டலுவல்கள் திணைக்களம்

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

DEPARTMENT OF MUSLIM RELIGIOUS AND CULTURAL AFFAIRS

කාර්යසාධන වාර්තාව - 2025

செயலாற்றுகை அறிக்கை – 2025

PERFORMANCE REPORT – 2025

DEPARTMENT OF MUSLIM RELIGIOUS AND CULTURAL AFFAIRS
180, T.B. JAYAH MAWATHA,
COLOMBO - 10.

පටුන :

පරිච්ඡේදය 01 -ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම.. 01
1.2 ආයතනයේ දැක්ම, අරමුණු සහ මෙහෙවර.. 02
1.3 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්.. 02
1.4 සංවිධාන ව්‍යුහය 04
1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 05
1.6 අමාත්‍යාශය / දෙපාර්තමේන්තු/ පළාත් සහා යටතේ පවතින ආයතන අරමුදල් 12
1.7 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති පිළිබඳ විස්තර... 12

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා අනාගත දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ, අභියෝග සහ අනාගත ඉලක්ක.. 12

පරිච්ඡේදය 03 – 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය ප්‍රකාශන
3.1.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය.. 15
3.1.2 මූල්‍ය තත්ව ප්‍රකාශනය... 16
3.1.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.. 17
3.1.4 වියදම් ප්‍රකාශන 18
3.2 ප්‍රතිපාදන උපයෝජනයේ කාර්යසාධනය.. 25
3.3 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය 25
3.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය.. 26
3.5 විගණකාධිපතිගේ වාර්තාව.. 27

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක...

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැළසුම් මත පදනම්ව) 38

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනාගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු... 39
5.2 තිරසිර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහන හා අභියෝග............................... 39

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය.. 40
6.2 මානව සම්පත් හිඟය ආයතනයේ කාර්යසාධනය කෙරෙහි බලපා ඇති ආකාරය 40
6.3 මානව සම්පත් සංවර්ධනය... 41

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව.. 42

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

ආයතනයේ නම : මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂය : 202

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 **හැඳින්වීම**

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතුවල ප්‍රගතිය හා අභිවෘධිය වෙනුවෙන් ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තුවයි. ඉස්ලාම් ආගමික චාරිත්‍ර හා සංස්කෘතික වටිනාකම්වලින් පෝෂණය වූ සාධාරණ සමාජයක් නිර්මාණය කිරීමේ දැක්ම සහිතව, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, මුස්ලිම් සමාජය සදාචාරාත්මක අභිවෘධිය සහ සුපෝෂණය කරා මෙහෙයවීමේ සියලු රාජකාරි ආශ්‍රිත වගකීම දරයි.

වකුෆ් පනතේ අරමුණු ක්‍රියාත්මක කිරීම සහ මුස්ලිම් පල්ලි, සාවියා, තක්කියා, මුස්ලිම් සිද්ධස්ථාන, අධ්‍යාත්මික නිකේතන සහ ශ්‍රී ලංකාවේ මුස්ලිම් පුණ්‍ය භාර පරිපාලනය කිරීම පිණිස, 1962 අංක 21 දරන පනතින් හා 1982 අංක 33 දරන පනතින් සංශෝධිත 1956 අංක 51 දරන වකුෆ් පනත මගින් පිහිටුවා ඇති වකුෆ් මණ්ඩලය සහ වකුෆ් විනිශ්චය සභාව සමග දෙපාර්තමේන්තුව මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනියි. ඒ අනුව මුස්ලිම් පල්ලි ලියාපදිංචිය, සහ මුස්ලිම් පුණ්‍ය භාර ලියාපදිංචිය, ලියාපදිංචි මුස්ලිම් පල්ලි හෝ පුණ්‍ය භාර හෝ වකුෆ්වල භාරකාර මණ්ඩලයේ රාජකාරි සහ කර්තව්‍ය නියමු කිරීම සහ තීරණය කිරීම සහ මුස්ලිම් පුණ්‍ය භාරවල අරමුදල් පවත්වා ගැනිම මෙම දෙපාර්තමේන්තුවේ කාර්යයන් සහ පරිපාලන කටයුතුවල අන්තර්ගත කර තිබේ. වකුෆ් පනතින් සපයා ඇති පරිදි පරිපාලනමය කටයුතු ආවරණය කිරීම සහ මුස්ලිම් ආගමික හා සංස්කෘතික අනන්‍යතාවය රැක ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමත් සමඟ සමාජයේ යහපැවැත්ම සඳහා සුභසාධන පහසුකම් සලසා දීම සහ මුස්ලිම් පල්ලි හා මුස්ලිම් සිද්ධස්ථාන සම්බන්ධ කටයුතු හසුරුවමින් පුණ්‍යාභාරය, මද්රාසා අරාබි පාසල් , මුස්ලිම් දහම් පාසල් (පාසල් දරුවන්ට කුර්ආනය කියවීම සහ ඉස්ලාම් දහම් අධ්‍යාපනය ලබා දීම) සහ හජ් වන්දනාව මෙන්ම මුස්ලිම් කලා, සාහිත්‍යය සහ සංස්කෘතික ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ද දෙපාර්තමේන්තුවේ අනෙකුත් කාර්යයන් වේ.

1.2 **ආයතනයේ දැක්ම, අරමුණු සහ මෙහෙවර**

දැක්ම

"තිරසාර ලෙස සංවර්ධිත ජාතියක්"

මෙහෙවර

ධර්මිෂ්ඨ, විනයගරුක නීතිගරුක සමාජයක් ආරක්ෂා කිරීම සඳහා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු නියාමනය හා පහසුකම් සැපයීම.

ඉලක්ක

1. ආගමික වටිනාකම් ප්‍රායෝගිකව සමාජයට ඇතුළත් කිරීම.
2. ශ්‍රී ලාංකික අනන්‍යතාවය සහිත සමාජයක් නිර්මාණය කිරීම.

අරමුණ

1. මුස්ලිම් පල්ලි , පුණ්‍යාගාර , අරාබි පාසල් (මද්රසා) සහ මුස්ලිම් දහම් පාසල් මග පෙන්වීම සහ නියාමනය කිරීම.
2. මුස්ලිම් ආගමික අධ්‍යාපනය පෝෂණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
3. මුස්ලිම් කලා හා සංස්කෘතික කටයුතු පෝෂණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
4. හජ් වන්දනාකරුවන් සඳහා පහසුකම් හා සේවා සැපයීම.
5. ඉස්ලාම් ආගමික හා සංස්කෘතික කටයුතු වල කැපී පෙනෙන මෙහෙවරක් සිදු කළ අයගේ සේවාවන් ඇගයීම.
6. ඉස්ලාමීය ආගමික චතාවත් පිළිපැදීම සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම(පස්වේල් නැමඳුම් කිරීම,රාමසාන් උපවාසය හා සකාත් වැනි සටහන්)
7. මුස්ලිම් සමාජයේ සමගිය පෝෂණය කිරීම සහ ජාතික ඒකාබද්ධතාව සඳහා කටයුතු කිරීම.
8. මුස්ලිම් කාන්තාවන් සහ තරුණයින් සවිබල ගැන්වීම සඳහා වැඩ සටහන් ක්රියාත්මක කිරීම.

1.3 **දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්**

1. වකූෆ් පනත ක්‍රියාත්මක කිරීම..
   (මුස්ලිම් පල්ලි, ආගමික සිද්ධස්ථාන හා පුණ්‍යාගාරයන් ලියාපදිංචිය සහ භාරකරුවන් පත් කිරීම මෙහෙයවීම හා නියාමනය කිරීම සහ මුස්ලිම් පුණ්‍යාධාර අරමුදල පවත්වාගෙන යාම සහ වකූෆ් පනත ක්‍රියාත්මක කිරීම.)
2. ලියාපදිංචි කරන ලද මුස්ලිම් දේවස්ථාන, මුස්ලිම් දහම් පාසල්, අරාබි විදුහල් යන ආගමික ස්ථාන හා සංස්කෘතික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සඳහා මූල්‍ය ආධාර ලබාදීම.
3. ජාතික මීලාදුන් නබි දිනය සනිටුහන් කරමින් සෑම වසරක් පාසාම දිවයිනේ එක් දිස්ත්‍රික්කයක් තෝරාගෙන එම දිස්ත්‍රික්කයේ ආගමික හා සමාජයීය සංවර්ධනය ඇති කිරීම. එහිදී අදාල ප්‍රදේශයේ මුස්ලිම් දේවස්ථාන, ආගමික ආයතන, පාසල්වල සංවර්ධන කටයුතු සිදුකිරීම, තරඟ හා ත්‍යාග ප්‍රදානෝත්සව සංවිධානය කිරීම, ආගමික පුරෝගාමීන්ට ගෞරවාචාරය පුදකිරීම, අදාල ප්‍රදේශයේ ඓතිහාසික වශයෙන් වැදගත්කම පිළිබඳ පොත් ප්‍රකාශනය යනාදී ක්‍රියාකාරකම් සිදු කිරීම.

4. 2024 සෞදි අරාබි රජයෙන් ශුද්ධ වූ හජ් වන්දනාව සඳහා කෝටා (Quota) 3500 ක් සහ නිදහස් ගමන් විසා (Free Movement Pass) 35 ක් ලබා දී තිබුණි.
5. 2024 වසර සඳහා ශුද්ධ වූ හජ් වන්දනාව සඳහා හජ් නියෝජිත ආයතන 124 ක් සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගි වී ඇති අතර එයින් හජ් නියෝජිත ආයතන 93 ක් හජ් වන්දනාකරුවන් රැගන ගොස් ඇත.
6. 2025 වර්ෂය සඳහා සෞදි අරාබිය රජයෙන් ශුද්ධ වූ හජ් වන්දනාව සඳහා කෝටා (Quota) 3500 ක් සහ නිදහස් ගමන් විසා (Free Movement Pass) 35 ක් ලබා දී ඇත.
7. 2025 වර්ෂයේ හජ් වන්දනා කටයුතු සඳහා හජ් නියෝජිත ආයතන තෝරා ගැනීමට අගෝස්තු මස සම්මුඛ පරීක්ෂණ සඳහා අයදුම්පත් කැඳවා තිබුණි.
8. ඒ අනුව සැප්තැම්බර් මස පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ සඳහා නියෝජිත ආයතන 114 ක් සහභාගි වූහ.
9. ඒ අතරින් 2025 වර්ෂය හජ් වන්දනාකරුවන් රැගෙන යාම සඳහා හජ් නියෝජිත ආයතන 92 ක් සුදුසුකම් ලබා ඇත.
10. ශ්‍රී ලාංකික මුස්ලිම් ජනතාව ශුද්ධ වූ හජ් වන්දනාවෙහි යෙදීම සඳහා අවශ්‍ය කටයුතු සලසාදීම.
11. දිවයින පුරා මුස්ලිම් දහම්පාසල් ගුරුභවතුන් සඳහා නිලඇඳුම් හා පුස්තකාල පොත් දීමනා ලබාදීම, දහම් පාසල් ගුරුභවතුන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම, දහම් පාසල් සඳහා විෂය නිර්දේශ හඳුන්වාදීම හා පෙළ පොත් මුද්‍රණය හා බෙදා හැරීම.
12. කලාකරුවන්ට ගෞරව සත්කාර දැක්වීම පිණිස වාර්ෂිකව සංස්කෘතික අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන කලාභූෂණ සම්මාන උළෙල සඳහා සුදුසු මුස්ලිම් කලාකරුවන් නිර්දේශ කිරීම.
13. මුස්ලිම් කතුවරුන් දිරිමත් කිරීම සඳහා ඔවුන් විසින් නිර්මාණය කරන ලද පොත් පත් මිලදී ගෙන මුස්ලිම් පාසල් පුස්තකාලවලට බෙදාහැරීම.
14. මුස්ලිම් කලා හා සංස්කෘතිය සුරැකීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම.
15. පල්ලි දායක සහා සාමාජිකයන්ට සහ මුස්ලිම් ආගමික ආයතනවල පරිපාලන සභා සාමාජිකයන්ට පුහුණු කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීම.
16. අන්තර්ජාතික අල්-කුර්ආන් පාරායන (කිරාත්) හා වනපොත් කිරීමේ තරඟ සඳහා තරඟකරුවන් තෝරා ගැනීම හා වාර්ෂිකව සෞදි අරාබිය, ඊජිප්තුව,මැලේසියාව සහ ඩුබායි යන විදෙස් රටවල තරඟ සඳහා යොමු කිරීම.
17. ඉස්ලාම් ආගමික පූජක තුමන්ලා (මවුලවිවරු) සඳහා හැඳුනුම්පත් ලබාදීම හා අවශ්‍ය පුහුණුවීම් ලබා දීම.
18. විදේශයන්හි ඉස්ලාමීය උසස් අධ්‍යාපනය සඳහා සිසුන් තෝරා ගැනීම
19. ශුද්ධ වූ රාමසාන් මාසයේ ආරම්භය සහ අවසානය නිවේදනය කිරීම සහ මුස්ලිම් රටවල් විසින් පරිත්‍යාග කරන ලද රට ඉඳි රාමසාන් මාසය තුළ ප්‍රධාන මුස්ලිම් පල්ලි හරහා දිස්ත්‍රික් මට්ටමින් රට පුරා මුස්ලිම් ජනතාව අතර බෙදා හැරීම.

1.4 සංවිධාන ව්‍යුහය



Organization Chart
Department of Muslim Religious and Cultural Affairs
Director SLAS - 1
AD (Admin) SLAS-II/III 1
Admin Officer MSO SUPRA 1
Translator 1
CMSO 1
MSO 6
K.K.S. 13
Driver 4
AD (Cultural) Non SLAS 1
Cultural Officer 2
MSO 2
AD (Religious) Non SLAS 1
DO 5
MSO 3
AD (Wakf) SLAS-II/III Eastern, Northern & North Central 1
DO 23
AD (Wakf) SLAS-II/III Central, Sabragamuwa & Uwa 1
DO 10
AD (Wakf) SLAS-II/III North West, Western & Southern 1
Wakf Board Secretary 1
Wakf Tribunal Secretary 1
DO 29
MSO 2
Accountant SLAcS-II/III 1
FA 1
MSO 5
Internal Auditor SLAcS-II/III 1
DO 2
MSO 2

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

දෙපාර්තමේන්තුව එහි කටයුතු කොළඹ ප්‍රධාන කාර්යාලයෙන් සිදු කරයි. එහි ප්‍රධාන අංශ 05 පහත දැක්වේ.

1. පරිපාලන අංශය
2. මූල්‍ය අංශය
3. ආගමික හා සංස්කෘතික කටයුතු හා හජ් අංශය
4. වකුෆ් හා සංවර්ධන අංශය
5. අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය

1. **පරිපාලන හා සංවර්ධන අංශය**

පරිපාලන අංශයේ ප්‍රධාන කර්තව්‍යය වන්නේ දෙපාර්තමේන්තුවට ස්ථාවර , කාර්යක්ෂම පරිපාලන සේවාවක් හා මානව සම්පත් සැපයීමයි.

පරිපාලන අංශයේ ප්‍රධාන කාර්යයන් වනුයේ :

- කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, ස්ථාපනය හා උසස් වීම් ලබාදීම.
- කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය
- නිපුණතා මට්ටම් ඉහළ නැංවීම සඳහා දෙපාර්තමේන්තුව සිය කාර්ය මණ්ඩලයට පුහුණු අවස්ථා ලබා දීම.
- කාර්ය මණ්ඩලයේ පුද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම.
- කාර්ය මණ්ඩලයේ නිවාඩු වාර්තාව නඩත්තු කිරීම
- කාර්ය මණ්ඩලය සම්බන්ධ දත්ත පද්ධතියක් පවත්වා ගැනීම.
- කාර්යාල ගොඩනැගිල්ල පිරිසිදු කිරීම, නඩත්තුව සහ ආරක්ෂක සේවාවවට අදාල කරුණු.
- වාහන නඩත්තුව සහ ප්‍රවාහන පහසුකම් සැපයීමට අදාළ කටයුතු .
- අනෙකුත් ආයතන සහ මහජනයාගෙන් ලැබෙන සියලුම ලිපි වාර්තා කිරීමේ පද්ධතියක් හරහා අදාළ අංශවලට යොමු කිරීම හා පසුවිපරම් කිරීම සහ ප්‍රගතිය පිළිබඳව අධ්‍යක්ෂතුමාට වාර්තා කිරීම.
- දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සමස්ත පරිපාලනය.

2. මූල්‍ය අංශය

දෙපාර්තමේන්තුවේ මූල්‍ය සම්පත් කළමණාකරණය මෙම අංශයේ ප්‍රධාන වගකීම වේ. මූල්‍ය, මෙහෙයුම් , වත්කම් කළමණාකරණය , මූල්‍ය වාර්තාකරණය , ගබඩා කළමණාකරණයට සහ ප්‍රසම්පාදන සේවා ඇතුළුව සහායක සේවා ගණනාවක් මෙම අංශය සපයයි.

මෙම අංශයේ ප්‍රධාන කාර්යයයන් වනුයේ :

- වාර්ෂික අයවැය ඇස්තමේන්තු කෙටුම්පත සකස් කිරීම
- අයවැය ප්‍රතිපාදන අඛණ්ඩව අධීක්ෂණය
- වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම
- මාසික බැංකු සැසඳුම් වාර්තා සකස් කිරීම (රජයේ අරමුදල් ගිණුම, හජ් අරමුදල සහ මුස්ලිම් පුණ්‍යාහාර අරමුදල් ගිණුම්).
- මාසික අක්මුදල් අයදුම්පත, අතැති බිල්පත් වාර්තාව සහ සේවක වාර්තාව සැම මසකම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.
- අත්තිකාරම් 'බී' ගිණුම පිළියෙල කිරීම
- පොදු තැන්පතු ගිණුම පවත්වාගෙන යාම
- පොත් වල ආදායම සහ වියදම් සටහන් කිරීම, ලිපි ලේඛන නඩත්තු කිරීම සහ හජ් අරමුදල් ගිණුම සහ මුස්ලිම් පුණ්‍යාධාර අරමුදල් ගිණුම සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම.
- අදාළ අමාත්‍යාංශයට හා අනෙකුත් ආයතනවලට මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම
- පරිපූරක සේවා සැපයීම සහ ප්‍රසම්පාදන කළමනාකරණය.
- දෙපාර්තමේන්තුවේ සියලුම අංශ සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ලිපි ද්‍රව්‍ය ලබා දීම.
- දෙපාර්තමේන්තුවට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.
- පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම.
- විගණකාධිපති සහ රාජ්‍ය ගිණුම් කාරක සභා විමසීම් වලට පිළිතුරු දීම.
- රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත මාර්ගගතව තොරතුරු ලබා දීම

3. ආගමික හා සංස්කෘතික කටයුතු අංශය

දෙපාර්තමේන්තුව සිදුකරනු ලබන සියලු ආගමික හා සංස්කෘතික ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම ආගමික හා සංස්කෘතික කටයුතු අංශයේ කාර්ය වේ.

ආගමික හා සංස්කෘතික කටයුතු අංශයේ ප්‍රධාන කාර්යයන් වනුයේ

- ජාතික නිදහස් දින ආගමික වැඩසටහන් සංවිධානය කිරිම.
- හජ් වන්දනාකරුවන් ලියාපදිංචිය හා දත්ත පවත්වාගෙන යාම, ආපසු ගෙවිය යුතු තැන්පතු මුදල් ලබා දීම සහ තැන්පතු මුදල් ආපසු ගෙවීමට පියවර ගැනීම.
- උම්රා සහ හජ් වන්දනාව සඳහා ක්‍රියාකරුවන් තෝරා ගැනීම සහ ලියාපදිංචි කිරීම.
- අහදියා දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් සහ පොත් දීමනා ලබා දීම. වසර 03ක් හෝ වැඩි කාලයක් සේවයේ නිරත දහම් පාසල් ගුරුවරුන් 2781 ක් සඳහා රු.7500/-ක දීමනාව සහ එක් වසරක සේවා කාලයක් හිමි දහම් පාසල් ගුරුවරුන් 1707 ක් සඳහා රු.5000/- ක දීමනාවක්ද ලබා දී ඇත.
- අහදියා දහම් පාසල් අවසන් සහතික පත්‍ර විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2025.08.23 සහ 24 වන දිනවල පවත්වා ඇත.
- අහදියා දහම් පාසල් ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව 640 කි. මෙම වසරේ ලියාපදිංචි කර ඇති අහදියා දහම් පාසල් සංඛ්‍යාව 19 කි.
- අහදියා දහම් පාසල් ගුරු පුහුණු වැඩ සටහන් එක් දිස්ත්‍රික්කයට එක බැගින් මෙම වැඩසටහන් 02 ක් කර ඇත.
- අහදියා දහම් පාසල් සිසුන් සඳහා නායකත්ව පුහුණුව, මත්ද්‍රව්‍ය නිවාරණ පුහුණු වැඩසටහන් දිස්ත්‍රික්ක 03 ක් තෝරා ගෙන කර ඇත.
- ලියාපදිංචි නොකරන ලද කුර්ආන් මද්රසා 192 ක් පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් මගින් ලබාගෙන ඒ පිළිබඳව සහ මෙම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කරන ලද කුර්ආන් මද්රසා 1676 පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් සකස් කරමින් පවතී. තවද, මෙම වසරේ කුර්ආන් මද්රසා 48 ක් ලියාපදිංචි කර ඇත.
- නව කුර්ආන් මද්රසා ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්පත් 185 ක් ලැබී ඇත.
- අරාබි විද්‍යාල ප්‍රතිසංස්කරණ හා ගොනු කළමණාකරන වැඩ සටහන යටතේ ගොනු යාවත්කාලීන කිරීම හා ගොනුවල අන්තර්ගතය සම්පූර්ණ කිරීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම සහ පොදු විෂය නිර්දේශයක් සකස් කිරීම.
- දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කරන ලද අරාබි විද්‍යාලවලින් ඔවුන්ගේ ඉල්ලීම මත සහතික පත් 74 ක් ලබා දී ඇත.
- සෞදි අරාබි තානාපති කාර්යාලය මගින් පරිත්‍යාග වශයෙන් ලැබෙන ලද මෙ.ටො.50 රටඉඳි තොගය රාමසාන් උපවාස සමයේදී රට පුරා පිහිටි මුස්ලිම් බැතිමතුන්ට මුස්ලිම් මහ පල්ලි හරහා බෙදා හැරීම.
- 2024 වර්ෂයට අදාල අල් කුර්ආන් වනපොත් කිරීමේ තරගයේ තැගි ප්‍රදානෝත්සවය 2025 ජනවාරි මස 20 වැනි දින කොළඹ ගෝල්ෆේස් හෝටලේදී, සවුදි අරාබි රජයේ තානාපති කාර්යාලයත් දෙපාර්තමේන්තුවත් එක්ව පවත්වන ලදී.

- සෞදි අරාබි තානාපති කාර්යාලය විසින් තෙවන වරට සංවිධානය කර ශුද්ධවූ අල් කුර්ආන් වනපොත් කිරීමේ තරගාවලිය 2025 වර්ෂය සඳහා දෙසැම්බර් මස 18,19,20 සහ 22යන දින වල කුරුණෑගල, මහනුවර සහ කොළඹ යන ස්ථානවල පවත්වා සිසුන් 200 ක් පමණ තෝරා ගන්නා ලදි. අවසන් තරගය 2026 ජනවාරි මස පැවැත්වීමට නියමිතය. මෙම තරගාවලියෙන් මැලේසියා, සවුදි අරාබියාව සහ ඊජිප්තුවට එක් ශිෂ්‍යයකු බැගින් සහභාගීවීමට අදාල කටයුතු සිදු කරනු ලබයි.
- රාමළාන් මාසයේදී උපවාසය නිමිත්තෙන් පවත්වන ලද වැඩසටහන 2025.03.26 මෙම බුදුධශාසන. ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.
- "කලාභූෂණ" සම්මාන උළෙල සඳහා මුස්ලිම් කලාකරුවන් 10 දෙනෙකුගේ නම් නිර්දේශ කිරීම.
- මුස්ලිම් ලේඛකයින් දිරිගැන්වීම සඳහා මුස්ලිම් ලේඛකයින් විසින් රචිත පොත් 46 ක් මිලදී ගැනීම සහ එම පොත් අහදියා දහම් පාසල් සහ මුස්ලිම් පාසල් වල පුස්තකාල සඳහා ලබා දීම.
- ආනයනය කරන ලද අල් - කුර්ආන් හා අනෙකුත් ආගමික ග්‍රන්ථ ආනයන කරනු ලබන ආයතන 08 ක් සඳහා ඉස්ලාම් ආගමික ග්‍රන්ථ වර්ග 364 ක් සහ පිටපත් 103063 ක් හා ශුද්ධ වූ අල් -කුර්ආන් 30263 ක් සඳහා නිර්දේශ ලබා දී ඇත. පුද්ගල පාවිච්චිය සඳහා පුද්ගලයන් 11 දෙනෙකුට ග්‍රන්ථ වර්ග 968 සඳහා නිර්දේශ ලබා දී ඇත.
- **මිහ්රාජ් රාත්‍රිය** – ශුද්ධ වූ මිහිරාජ් දිනය සැමරීම (මුහම්මද් නබිතුමා වෙත පස් වතාවක් යාඥාවන් පිරිනැමූ දිනය). 2025 වර්ෂයේ ජනවාරි 27 වන දින අධ්‍යක්ෂතුමාගේ ප්‍රධානත්වයෙන් අංක 16, සෙයිමන් පාර, කොළඹ-10 පිහිටි මස්ජිදුල් සකීර් ජුම්මා මුස්ලිම් පල්ලියේදී ශුද්ධ වූ මිහිරාජ් රාත්‍රිය නිමිත්තෙන් ආගමික වතාවත් සිදු කරන ලදී.
- මුස්ලිම් අධ්‍යාත්මික නායකයින්, කථිකාචාර්යවරුන් සහ සිසුන් සඳහා ප්‍රවේශ සහ නේවාසික වීසා ලබා ගැනීම සඳහා නිර්දේශ ලිපි 35 නිකුත් කිරීම.
- ජාතික හැඳුනුම්පත්වල මුස්ලිම් පූජක හිමිකම් ලබා ගැනීම සඳහා සහතිකයක් 70 නිකුත් කිරීම.
- විදේශ විශ්ව විද්‍යාල සඳහා මෙරටින් තේරී පත් වූ සිසුන් සඳහා විරෝධතාවයක් නොමැති බැවින් සිසුන් 20 දෙනෙකුට මෙවැනි ලිපි නිකුත් කර ඇත.
- ඉස්ලාම් ආගම වැලඳගත් පුද්ගලයින්ගේ ඉල්ලීම මත මෙවැනි ලිපි 19 ක් ලබා දී ඇත.
- කලා හා සංස්කෘතික වැඩසටහන - කවි සංසද පැවැත්වීම සහ පොත් ප්‍රකාශයට පත් කිරීම.
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්තික සමාජවාදී ජනරජයේ 78 වන නිදහස් දිනය සමගාමීව පවත්වන ඉස්ලාම් ආගමික මෙහෙය 2025 පෙබරවාරි 04 අඟහරුවාදා දින වැල්ලවත්ත ජුම්මා පල්ලියේදී සිදු කරන ලදී.

- මුස්ලිම් දින දර්ශනයට අනුව අලුත් අවුරුදු සැමරුම (මුහර්රම්) සහ නව සඳ බැලීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා 2025 වර්ෂයට අදාල මුස්ලිම් දින දර්ශනය සකස් කිරීම.
- මුහර්රම් උත්සවය:- 2025 (හිජ්රි වර්ෂ 1447) නව අවුරුදු උදාව සනිටුහන් කිරීමේ උත්සවය 2025.06.27 වන දින කොළඹ -02, වැකන්ද ජුම්මා පල්ලියේදී සිදු කරන ලදී.
- 2025 වර්ෂයේ හජ් වන්දනාව සඳහා වූ පළමුවන හජ් නඩය මක්කමට පිටත් කිරීම සඳහා වූ වැඩසටහන ගරු.අමාත්‍යතුමාගේ සහ තානාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක ජාත්‍යාන්තර ගුවන් තොටුපොළේදි 2025.05.02 වන සිකුරාදා දින පැවැත්විණි.
- ජාතික මීලාද්- උන්- නබි වැඩසටහන් - 2025 වර්ෂය සඳහාවූ ජාතික මිලාද්-දුන් නබි සැමරුම් උත්සවය හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෝලාන අරුසියා ජුම්මා පල්ලියේදි 2025.09.05 වන දින ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානාත්වයෙන් පැවැතිවිණි. එම උත්සවයේදී මිලාද් තරග හා නව මුද්දරයක් එළි දැක්වීම හා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉතිහාස පොතක් එළි දක්වා ඇත.

4. වකුෆ් අංශය

වකුෆ් අංශයේ ප්‍රධාන කාර්යය වනුයේ මුස්ලිම් පල්ලි හා පුණ්‍යාහාර පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරිමයි.

වකුෆ් අංශයේ ප්‍රධාන කාර්යයන් වනුයේ

- දිවයිනේ සියලු දිස්ත්‍රික්කවල පිහිටි මුස්ලිම් පල්ලි, සිද්ධස්ථාන හා පුණ්‍යාහාර ලියා පදිංචි කිරිම සහ ලියාපදිංචි අංක නිකුත් කිරීම.
- මුස්ලිම් පල්ලි, සිද්ධස්ථාන හා පුණ්‍යාහාර වල භාරකරුවන් තෝරා ගැනීම සඳහා කටයුතු කිරිම.
- මුස්ලිම් පල්ලිවල භාරකරුවන් පත්කිරීමේ සහතිකය නිකුත් කිරිම. 2025 වර්ෂයේදී පල්ලිවල භාරකරුවන් පත්කිරීමේ සහතික 134 ක් නිකුත් කර තිබේ.
- පල්ලි 122 ක් දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කර ඇත.
- ලියාපදිංචි කරන ලද පල්ලි, සිද්ධස්ථාන හා පුණ්‍යාහාරවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ලබා ගැනීම, එම මූල්‍ය ප්‍රකාශන පරික්ෂා කිරිම හා මුස්ලිම් පුණ්‍යාහාර අරමුදල සඳහා දායක මුදල් ලබා ගැනීම. සහ එම මුදල පරිභාජනය කිරීමට අදාල කටයුතු කිරිම.
- මුස්ලිම් පල්ලි පරිපාලනය පිළිබඳ ගැටලු, අභියාචනා, පෙත්සම් නිරාකරණය කිරිම හා වකුෆ් මණ්ඩලයට යොමු කිරිම. සභා රැස්වීම් 30ක් පමණ පවත්වා ඇත.
- ලියාපදිංචි පල්ලි, සිද්ධස්ථාන සහ පුණ්‍යාහාර පිළිබඳ දත්ත පද්ධතිය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. 2025දී දත්ත පද්ධතියක් ආරම්භ කර ගොනු 130 ක් පමණ පද්ධතියට යොමු කර ඇත.

- ලියාපදිංචි වී ඇති සියලුම මුස්ලිම් පල්ලිවල භාරකරුවන්ගේ විස්තර, වගකීම් පිළිබඳ හා වත්කම් පරිපාලන කිරීම පිළිබඳව භාරකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. මොණරාගල දිස්ත්‍රක්කයේදී එක් වැඩසටහනක්, හම්බන්තොට දිස්ත්‍රක්කයේදී එක් වැඩසටහනක් හා ත්‍රිකුණාමල දිස්ත්‍රක්කයේදී වැඩසටහන් 03ක් සහ ගම්පහ දිස්ත්‍රික්කයේදී වැඩසටහන් 02 ක් පවත්වා ඇත.
- මුස්ලිම් පල්ලි, සිද්ධස්ථාන හා පුණ්‍යාභාර වල කුලී සහ බද්දට දීම සම්බන්ධව කටයුතු කිරීම.
- වකුෆ් මණ්ඩලය, වකුෆ් විනිශ්චය සභාව සහ අධිකරණ තීන්දු ප්‍රකාශන හා මගපෙන්වීම පිළිපැදීම.
- භාරකරුවන්ට අවශ්‍ය යෝජනා දීම හා මගපෙන්වීම.

සංවර්ධන අංශය

සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ දෙපාර්තමේන්තුව විසින් සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද මුදල් සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගැනීමට සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීමය.

1. සංවර්ධන ව්‍යාපෘති මගින් මුස්ලිම් පල්ලි හා ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම/ ප්‍රතිසංස්කරණය
2. මීලාද් සංවර්ධන ව්‍යාපෘතිය හරහා මුස්ලිම් පල්ලි හා ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම/ ප්‍රතිසංස්කරණය

සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යයන්

- දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් හරහා දිවයින පුරා පිහිටි මුස්ලිම් පල්ලි හා ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම/ප්‍රතිසංස්කරණය කිරීම.
- දිවයින පුරා පිහිටි මුස්ලිම් පල්ලි හා ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම /ප්‍රතිසංස්කරණය කිරීම සඳහා තෝරා ගැනීම.
- මුස්ලිම් පල්ලි සහ ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ජාතික මීලාදුන් නබි උත්සවය පවත්වනු ලබන දිස්ත්‍රික්කය තුල දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් හරහා මුස්ලිම් පල්ලි හා ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම/ප්‍රතිසංස්කරණය කිරීමට මූල්‍ය ආධාර ලබා දීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම.
- කාර්තුමය වශයෙන් අමාත්‍යාංශය වෙත ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම.
- පසු විපරම් හා අධීක්ෂණයෙන් පසු සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ අවසන් වාර්තාව ඉදිරිපත්කිරීම.
- 2025 වර්ෂයට අදාල සංවර්ධන ව්‍යාපෘති සඳහා රුපියල් ලක්ෂ 4 බැගින් මුස්ලිම් පල්ලි 29 ක් සහ ලක්ෂ 4.25 බැගින් මුස්ලිම් පල්ලි 8 ක් සහ මීලාද් සංවර්ධනය සඳහා රුපියල් මිලියන් දහයක් පල්ලි 19 කට බෙදා දෙන ලදී.

3. අභ්‍යන්තර විගණන සහ විමර්ශන අංශය

දෙපාර්තමේන්තුවේ කටයුතුවල මූල්‍ය සහ පරිපාලනයෙහි පාලන ක්‍රමයක් ක්‍රමානුකූලව පවත්වා ගැනීම පිණිස අභ්‍යන්තර විගණන ක්‍රමයක් හඳුන්වා දීම.

අභ්‍යන්තර විගණන සහ විමර්ශන අංශයේ ප්‍රධාන කාර්යයන් වනුයේ:

- විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම.
- වකුෆ් මණ්ඩලයට ලැබෙන පෙත්සම් පදනම් කරගනිමින් පරීක්ෂණ පිළිබඳව වාර්තා කිරීම.
- වාර්ෂික විගණන පරික්ෂණ සිදු කිරීම.

ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලය

මුස්ලිම් පල්ලි, සිද්ධස්ථාන, ආගමික නිකේතන සහ පුණ්‍යාහාර ලියාපදිංචි කිරීම, භාරකරුවන් පත් කිරීම, ආරවුල් විසඳීම, නඩු විභාග කිරීම සහ නියෝග නිකුත් කිරීම, මාර්ගෝපදේශ හා චක්‍රලේඛ නිකුත් කිරීම සහ පුණ්‍යාහාර හෝ වකුෆ් පනත ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලයේ ප්‍රධාන කාර්යයාන් වේ.

ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලයේ සාමාජිකයන්

1.	එම්.එල්.එම්.එච්.එම්. මොහිඩීන් හුසයින් මහතා -	-සභාපති
2.	ආචාර්ය පී.සී. පී. ජවුෆර්	-සාමාජික
3.	නීතිඥ එම්.ඒ. මතීන්	-සාමාජික
4.	එම්.මුස්තෆා රසා එම්. සෆර් මහතා	-සාමාජික
5.	මාහිල් ඩූල් මහතා	-සාමාජික
6.	මවුලවි එම්.එන්.එම්. ඉජ්ලාන්	-සාමාජික
7.	මවුලවි එම්.අයි. ජබ්බාර්	-සාමාජික

2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වකුෆ් මණ්ඩලයේ ප්‍රගතිය

1. 2025 වර්ෂය තුල වකුෆ් සභා රැස්වීම් 60ක් පවත්වා ඇත.
2. මුස්ලිම් පල්ලි 134 කට නව භාරකරුවන් පත් කර ඇත..
3. මුස්ලිම් පල්ලි විමර්ශන පිළිබඳ නඩු විභාග 17 ක් පැවැත්විණි.
4. අභියාචනා අධිකරණයේ නඩු 18ක් ගොනු කර ඇත.
5. නඩු 11ක් වකුෆ් මණ්ඩලයට බාරදී ඇත.

වකුෆ් විනිශ්චය සභාව

වකුෆ් විනිශ්චය සභාව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකු විසින් පරිපාලනය කරනු ලබන අතර මාසිකව අවම වශයෙන් රැස්වීම් වාර දෙකක් පවත්වනු ලබයි. වකුෆ් සභාව විසින් නිකුත් කරන ලද තීන්දුවලට එරෙහිව අභියාචනා කරන ලද අධිකරණයකි. එය දිසා අධිකරණයක අධිකරණ බලය ඇති අධිකරණයකි. තවද, වකුෆ් දේපළ සහ වකුෆ් පුණ්‍යාහාර පනත සම්බන්ධ නඩු විමසීම වකුෆ් විනිශ්චය සභාවේ කාර්යභාරය වේ.

වකුෆ් විනිශ්චය සභාවේ සංයුතිය

ආචාර්ය යූ.එල්.ඒ. මජීඩ් මහතා (විශ්‍රාමික මහාධිකරණ විනිසුරු)	- සභාපති
ඒ.ඒ.එම්. ඉල්ලියාස් මහතා (ජනාධිපති නීතිඥ)	- සාමාජික
ඒ.ඩබ්ලියූ.එම්. ඉම්තියාස් මහතා (ජ්‍යෙෂ්ඨ නීතිඥ)	- සාමාජික

2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වකුෆ්විනිශ්චය සභාවේ ප්‍රගතිය

- වකුෆ් විනිශ්චය සභා මණ්ඩල රැස්වීම් 26ක් පවත්වා ඇත.
- වකුෆ් විනිශ්චය සභා මණ්ඩලයේ නඩු 18 ක් ගොනු කර ඇත.
- නඩු 11කට තීන්දු ලබා දී ඇත.
- 2025 වර්ෂය තුල තවදුරටත් නඩු 38ක් විභාග වෙමින් පවති.

1.6 අමාත්‍යාංශය / දෙපාර්තමේන්තු/ පළාත් සභා යටතේ පවතින ආයතන අරමුදල්

මෙම දෙපාර්තමේන්තුවට අරමුදල් ලැබී ඇත්තේ භාණ්ඩාගාරයෙන් පමණි.

1.7 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති පිළිබඳ විස්තර

අදාළ නොවේ

***පරිච්ඡේදය 02 — ප්‍රගතිය හා අනාගත දැක්ම**

2.1 **විශේෂ ජයග්‍රහණ, අභියෝග සහ අනාගත ඉලක්ක**

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂයේදී ආගමික වැඩසටහන් රැසක් පවත්වා, මුස්ලිම් පල්ලිවල භාරකරුවන් පත් කර, හජ් වන්දනාව සහ මද්‍රාසා සහ අරාබි විද්‍යාලවල විෂය නිර්දේශය ප්‍රතිසංස්කරණය කර ඇත. මුස්ලිම් ප්‍රජාවගේ යහපැවැත්ම සඳහා 2025 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ජයග්‍රහණයන් අත්පත් කරගන්නා ලදී.

2025 වසරේ දෙපාර්තමේන්තුවේ විශේෂ ජයග්‍රහණ

- සියලුම අරාබි විද්‍යාල සඳහා නව පොදු විෂය නිර්දේශ සහ විෂයමාලා සකස් කර ඇත. එය ඉංග්‍රීසි මාධ්‍යයට පරිවර්තනය කර ඇත.
- මුහම්මද් නබිතුමාගේ උපන් දිනය සංකේතවත් කරමින් ජාතික මීලාද්-උන්-නබි උත්සවය පැවැත්වීය.

- පරිත්‍යාග වශයෙන් සෞදි අරාබියෙන් රට ඉඳි මෙට්‍රික් ටොන් 50ක තොගයක් ලැබුණු අතර සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මුස්ලිම් පවුල් අතර බෙදා දෙන ලදී.
- වසර 03ක් හෝ ඊට වැඩි කාලයක සේවයේ නිරත දහම් පාසල් ගුරුවරුන් 2781 ක සඳහා රු.7500/-ක දීමනාව සහ එක් වසරක සේවා කාලයක් හිමි දහම් පාසල් ගුරුවරුන් 1707 ක් සඳහා රු.5000/- ක පොත් දීමනාව ලබා දීම.
- මුස්ලිම් පොත් ලේඛකයින් 57 දෙනෙකු දිරිමත් කිරීම.
- හජ් වන්දනාකරුවන් 3500 දෙනෙකුගෙන් 2025 දී හජ් ඉටු කිරීම සඳහා මක්කම වෙත ගොස් ඇති අතර, නිදහස් ගමන් බලපත්‍ර (Free Movement Pass) 35 කි.
- ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම ඉස්ලාමීය මධ්‍යස්ථාන ඉදිවෙමින් පවතින මුස්ලිම් පල්ලි 19 ක් ප්‍රතිසංස්කරණය කර ඇත.
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මිලාද්-උන්-නබි සංවර්ධන වැඩසටහන යටතේ මුස්ලිම් පල්ලි 19 ක් ප්‍රතිසංස්කරණය කරන ලදී.
- කුර්ආන් පාඨ සහ ආගමික පාඨ 360 ක් සඳහා නිර්දේශ ලබා දී ඇත.

- **ජාතික මීලාද් උන් නබි වැඩසටහනේ ප්‍රගතිය - 2025**

2025 වර්ෂය සඳහා ජාතික මිලාද්-උන්-නබි උත්සවය 2025.09.05 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්ගේ සහභාගීත්වයෙන් සහ සියලුම ආගමික නිකායන්හි අධ්‍යාත්මික නායකයින්ගේ ආශිර්වාදයෙන් සහ ආරාධිතයින් සහ 1000 කට අධික මහජනතාවගේ සහභාගීත්වයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් අම්බලන්තොට ප්‍රාදේශීය කොට්ඨාසයට අයත් බෝලාන අරූසියා ජුම්මා පල්ලියේදී පැවැත්විණි.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මෙවර පාදක කරගත් හම්බන්තොට නගරයේ පිහිටි ධර්මකබීර් ජුම්මා මහා පල්ලියේ ඡායාරූපය සහ හඳුන්වාදීමේ සටහන සහිත සමරු මුද්දරයක් 2025.09.05 වන දින නිකුත් කෙරිණි.

2025 වර්ෂය සඳහා අභියෝග

- අරාබි විදුහල් 82 කින් ලියාපදිංචිය සඳහා අයදුම්පත් ලැබී ඇත.
- මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් ලබා ගැනීම වැඩි කළ යුතුය.
- මුස්ලිම් පල්ලි හා ආගමික ස්ථාන සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
- මුස්ලිම් පල්ලි ලියාපදිංචි කිරීම සහ පවතින දත්ත සංශෝධනය කිරීම.
- කලාව, සාහිත්‍යය සහ සංස්කෘතිය ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.
- මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු 5ක් පුරප්පාඩු වී ඇත.

අනාගත ඉලක්ක

- මුස්ලිම් පල්ලි සඳහා කළමනාකරන තොරතුරු ක්‍රමවේදයක් සකස් කිරීම (MIS)
- දෙපාර්තමේන්තුව සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම.
- දෙපාර්තමේන්තුගත සහකාර අධ්‍යක්ෂවරුන් 02 ක් බඳවා ගැනීම.
- මු.රේ 71 අනුව වක්ෆ් මණ්ඩලය හා වකුෆ් විනිශ්චය සභාව සඳහා නීති නිලධාරි, තොරතුරු තාක්ෂණ නිලධාරි, ලිපිකරු, සහ කාර්යාල සේවක සේවයේ නිලධාරියෙකු බඳවා ගැනීම.
- හජ් පනත අනුමත කිරීම.

පරිච්ඡේදය 03

3.1.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

ඒසීඒ -එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	තත්‍ය 2025 රු.	2024 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ -1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ -1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ -1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ඒසීඒ -1
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
	භාණ්ඩාගාර අග්‍රිම		178,315,000	152,698,000	ඒසීඒ -3
-	තැන්පතු		634,033	166,820	ඒසීඒ -4
-	අත්තිකාරම් ගිණුම්		2,499,436	3,607,477	ඒසීඒ -5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**181,448,469**	**156,472,297**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**181,448,469**	**156,472,297**	
-	**භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)**		**41,000**		
-	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)**		**181,407,469**	**156,472,297**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**				
84,680,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	83,489,318	71,768,856	ඒසීඒ -2(ii)
110,470,800	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	63,470,254	64,440,430	ඒසීඒ -2(ii)
50,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	-	10,370	ඒසීඒ -2(ii)
-	පොළී ගෙවීම්	8		-	ඒසීඒ -2(ii)
30,175,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	30,036,000	22,625,952	ඒසීඒ -2(ii)
225,375,800	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**176,995,572**	**158,845,608**	
	මූලධන වියදම්				
3,400,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	2,948,467	737,803	ඒසීඒ -2(ii)
2,100,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	1,566,849	1,988,639	ඒසීඒ -2(ii)
25,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	23,156,128	17,024,286	ඒසීඒ -2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13		-	ඒසීඒ -2(ii)
500,000	හැකියා වර්ධනය	14	488,415	334,500	ඒසීඒ -2(ii)
	වෙනත් මූලධන වියදම්	15			ඒසීඒ -2(ii)
31,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**28,159,859**	**20,085,229**	
	තැන්පතු ගෙවීම්		632,409	230,444	ඒසීඒ -4
	අත්තිකාරම් ගෙවීම්		3,023,820	1,897,315	ඒසීඒ -5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**3,656,229**	**2,127,759**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**208,811,661**	**181,058,596**	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**(27,404,192)**	**(24,586,299)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(27,404,192)	(24,586,299)	ඒසීඒ -7
256,375,800	**දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය**		-	-	ඒසීඒ -3

3.1.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

ඒසීඒ-8

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	සත්‍ය 2025 රු.	2024 රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	360,604,276	361,892,510
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(අ)	6,245,278	5,720,894
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		366,849,553	367,613,404
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම		6,135,278	5,612,517
දේපළ පිරියත හා උපකරණ සංචිතය		360,604,276	361,892,510
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(ආ)	-	-
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	110,000	108,376
අයිරා ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		366,849,553	367,613,404

පිටු අංක......7....සිට ......27... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ......28.... සිට ......56.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති **රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, විට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචනා සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී	ගණන්දීමේ නිලධාරී	ගණකාධිකාරී
ඩබ්ලිව්.පී.සේනාධීර	එම්.එස්.එම්.නවාස්	එස්.එල්.එම්.නිබ්රාස්
ලේකම්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	අධ්‍යක්ෂ, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
දිනය: .02.2026	දිනය: 23 .02.2026	දිනය: 23 .02.2026

Prince Senadeera
Secretary
Ministry of Buddhasasana, Religious and Cultural Affairs
135, Srimath Anagarika Dharmapala Mawatha
Colombo 07.

2

එම්.එස්.එම්. නවාස්
අධ්‍යක්ෂ
මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
අංක. 180, ටී.බී. ජයා මාවත,
කොළඹ - 10.

එස්.එල්.එම්. නිබ්රාස්
ගණකාධිකාරී
මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
කොළඹ 10.

Scanned with CamScanner

3.1.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

		ජ්සීජ් -සී
2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය		
	තත්‍ය	
	2025	**2024**
	රු.	රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	5,495,806	3,903,605
අග්‍රිම ලැබීම්	178,315,000	152,698,000
අත්තිකාරම් අයකර ගැනීම්	1,924,386	1,981,102
තැන්පතු ලැබීම්	634,033	166,820
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**186,369,225**	**158,749,527**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	173,719,694	152,171,269
සහනාධාර සහ මාරුකිරීම්	-	10,370
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්		
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	4,072,670	1,879,401
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	41,000	
අත්තිකාරම් ගෙවීම්	3,023,820	1,397,100
තැන්පතු ගෙවීම්	632,409	230,444
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**181,489,594**	**155,688,584**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**4,879,631**	**3,060,943**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	4,879,631	3,060,943
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**4,879,631**	**3,060,943**
ඊ)=(ඈ)-(ඉ)	**(4,879,631)**	**(3,060,943)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**-**	**-**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)	**-**	
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.1.4 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

ඇමුණුම -2

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

වියදම් ශීර්ෂ අංකය : 202

දෙපාතර්මේන්තුවේ නම : මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාතර්මේන්තුව

රු.

වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය	වියදමෙහි නම	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරු කිරීම (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුළු වියදම (5)	ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම) (6)=(4)-(5)
වැඩසටහන (1)	(1) පුනරාවර්තන	-	-	-	-	-	-
	(2) ප්‍රාග්ධන	-	-	-	-	-	-
	උප එකතුව	-	-	-	-	-	-
වැඩසටහන (2)	(1) පුනරාවර්තන	179,000,000	46,375,800	15,272,624 (15,272,624)	225,375,800	176,995,572	48,380,228
	(2) ප්‍රාග්ධන	31,000,000	-	-	31,000,000	28,159,859	2,840,141
	උප එකතුව	**210,000,000**	**46,375,800**	-	**256,375,800**	**205,155,432**	**51,220,368**
	මුළු එකතුව	**210,000,000**	**46,375,800**	-	**256,375,800**	**205,155,432**	**51,220,368**

....

එස්.එල්.එම්. නිබ්රාස්

ගණකාධිකාරී

දිනය : 23.02.2026

එස්.එල්.එම්. නිබ්රාස්
ගණකාධිකාරී
මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු
දෙපා[illegible]
කොළඹ [illegible]

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වෂර්ය සඳහා වියදම් ප්‍රකාශනය

වියදම් ශීෂර් අංකය : 202

දෙපාතර්මේන්තුවේ නම : මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාතර්මේන්තුව

රු.

වැය විෂයය	සටහන	මූල්‍ය සංකේත අංකය	ප්‍රතිපාදනය				වියදම			ශුද්ධ බලපෑම		
			වාෂරීක අයවැයගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.රෙ. 66/69 මාරු කිරීම්	මුළු ශුද්ධ ප්‍රතිපාදන	මුදල් පොතට අනුව වියදම	මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යංශ/ දෙපාතර්මේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව)	මුළු වියදම	ඉතිරිය / (ඉක්මවීම්)	ඉතිරිය / (ඉක්මවීම්) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස	වෙනස්කම්වලට හේතු
			(1)	(2)	(3) (-)/+	(4)=(1)+(2)+(3)	(5)	(6)	(7)= (5)+(6)	(8)=(4)-(7)	(9)=(8)/(4) *100	
පුනරාවතර්න වියදම්												
වැඩසටහන (2)												
වැඩසට./ව්‍යාපෘ./උප ව්‍යාපෘ./වැය විෂයය/අයිතමය												
වැය විෂය අනුව වගරීකරණය කරන ලද වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5											
පුද්ගලික දීමනා												
1001 - වැටුප් හා වේතන		11	42,000,000	-	12,797,624	54,797,624	54,537,843	-	54,537,843	259,781	0	
1002 - අතිකාල හා නිවාඩු දින ගෙවීම්		11	2,000,000	-	-	2,000,000	1,583,019	-	1,583,019	416,981	21	බොහෝ වැඩසටහන් ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සහාය ඇතිව පවත්වන ලද බැවින් ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු විය.
1003 - වෙනත් දීමනා		11	33,000,000	-	(5,117,624)	27,882,376	26,608,081	760,375	27,368,456	513,920	2	
එකතුව			77,000,000	-	7,680,000	84,680,000	82,728,943	760,375	83,489,318	1,190,682	1	
වැය විෂය අනුව වගරීකරණය කරන ලද අනෙකුත් භාණ්ඩ හා සේවා	6											
ගමන් වියදම්												
1101 - දේශීය		11	2,000,000	-	-	2,000,000	1,709,491	-	1,709,491	290,509	15	දෙසැම්බර් බිල්පත් 2026 ජනවාරි මාසයේ ගෙවා ඇත.
1102 - විදේශීය		11	2,000,000	-	-	2,000,000	1,000,540	-	1,000,540	999,460	50	හජ් අරමුදලෙන් හජ් වන්දනාවේ ගමන් වියදම් දැරීම ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු විය.
එකතුව (අ)			4,000,000	-	-	4,000,000	2,710,031	-	2,710,031	1,289,969	32	
සැපයීම්												
1201 - ලිපිද්‍රව්‍ය හා කාය්‍යාලීය අවශ්‍යතා		11	3,200,000	-	-	3,200,000	2,681,589	204,712	2,886,301	313,699	10	2025 දී නිකුත් කරන ලද රු. 160,000 ක පොරොත්තු ඇණවුම් සහ රු. 46,000 ක දෙසැම්බර් බිල්පතක් 2026 ජනවාරි මාසයේදී පියවන ලදී.
1202 (2) - ඉන්ධන දීමනාව		11	1,200,000	-	-	1,200,000	754,056	-	754,056	445,944	37	අධ්‍යක්ෂවරයා තම පෞද්ගලික වාහනය පරිහරණය කිරීම සහ ඉන්ධන මිල අඩු වීම ඉතුරුම් වලට හේතු විය.
1202 (9) - සංචිත වාහන සඳහා ඉන්ධන දීමනාව		11	2,000,000	-	(450,000)	1,550,000	1,330,103	-	1,330,103	219,897	14	අතියම් ඉතුරුම්
1203 - ආහාර පාන හා නිල ඇඳුම්		11	100,000	-	-	100,000	20,000	-	20,000	80,000	80	දීමනා සඳහා හිමිකම් ඇති නිලධාරීන් සීමිත වීම.
එකතුව (ආ)			6,500,000	-	(450,000)	6,050,000	4,785,748	204,712	4,990,460	1,059,540		
නඩත්තු වියදම්												
1301 - වාහන		11	1,500,000	-	-	1,500,000	622,530	-	622,530	877,470	58	සීමිත නඩත්තු අවශ්‍යතාවය ඉතුරුම් වලට හේතු විය
1302 - පිරියත සහ යන්ත්‍රෝපකරණ		11	800,000	-	-	800,000	369,832	-	369,832	430,168	54	සීමිත නඩත්තු අවශ්‍යතාවය ඉතුරුම් වලට හේතු විය
1303 - ගොඩනැගිලි සහ ඉදිකිරීම්		11	1,000,000	-	-	1,000,000	48,820	-	48,820	951,180	95	වර්ෂය තුල ප්‍රමාණවත් නඩත්තු අවශ්‍යතාවයක් ඇති නොවීම.
1304 - මෘදුකාංග නඩත්තු		11	500,000.00	-	-	500,000.00	23,000	-	22,999.68	477,000.32	95	නව පද්ධතිය 2024 දී ස්ථාපනය කරන ලද අතර 2026 වර්ෂය තුල නඩත්තු වියදම් ගෙවිය යුතුය.
එකතුව (ඇ)			3,800,000	-	-	3,800,000	1,064,181	-	1,064,181	2,735,819		
සේවා												
1401 - ප්‍රවාහන		11	200,000	-	450,000	650,000	613,262	-	613,262	36,738	6	අතියම් ඉතුරුම්
1402 - තැපැල් හා සන්නිවේදන		11	1,500,000	-	25,000	1,525,000	1,450,041	-	1,450,041	74,959	5	අතියම් ඉතුරුම්
1403 - විදුලිය හා ජලය		11	4,000,000	-	-	4,000,000	3,414,367	-	3,414,367	585,633	15	දෙසැම්බර් බිල්පත් 2026 ජනවාරි මාසයේ ගෙවා ඇත.
1404 - බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු		11	500,000	-	500,000	1,000,000	988,765	-	988,765	11,235	1	අතියම් ඉතුරුම්
1405 - පිරිසිදු කිරීමේ හා සනීපාරක්ෂක සේවා		11	2,000,000	-	-	2,000,000	1,501,502	-	1,501,502	498,498	25	දෙසැම්බර් බිල්පත් 2026 ජනවාරි මාසයේ ගෙවා ඇත.
1407 - ආරක්ෂක සේවා		11	2,500,000	-	-	2,500,000	1,638,433	-	1,638,433	861,567	34	දෙසැම්බර් බිල්පත් 2026 ජනවාරි මාසයේ ගෙවා ඇත.
1409 - වෙනත්		11					-					
1409 (35) - රටඉඳි නිශ්කාෂණ, රේගු බදු හා ප්‍රවාහනය		11	-	-	-	-	-	-	-	-	-	
1409 (36) - දහම් පාසල් වාර්ෂික ජාතික විභාගය පැවැත්වීම		11	20,000,000	-	(9,680,000)	10,320,000	-		-	10,320,000	100	විභාග දෙපාර්තමේන්තුව විසින් අදාළ වියදම් දරණ බව දැනුම් දෙන ලදී.
1409 (99) - අනෙකුත්		11	10,000,000	-	1,500,000	11,500,000	8,245,027	2,310,791	10,555,818	944,182	8	අතියම් ඉතුරුම්
1409 (138) - යන්ත්‍රෝපකරණ සහ කාර්යාල උපකරණ ගිවිසුම්		11	1,000,000	-	-	1,000,000	858,909	-	858,909	141,091	14	දෙසැම්බර් බිල්පත් 2026 ජනවාරි මාසයේ ගෙවා ඇත.
1409 (139) - වාහන රක්ෂණ		11	300,000	-	-	300,000	81,150	-	81,150	218,850	73	අඩුම පිරිවැයක් සහිත රක්ෂණ ආවරණය ලබාගැනීම ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු විය.
1409 (140) - විවිධ සේවා වියදම්		11	450,000	-	-	450,000	329,331	-	329,331	120,669	27	දෙසැම්බර් බිල්පත් 2026 ජනවාරි මාසයේ ගෙවා ඇත.
011-1409-0-17 - රට ඉඳි ආනයනය සහ බෙද හැරීම (දේශීය)		17	14,000,000	26,565,200	-	40,565,200	33,274,005	-	33,274,005	7,291,195	18	තීරුබදු ගාස්තු පියවූ පසු ඉතිරි වූ ප්‍රතිපාදනය වේ.
011-1409-0-13 - රට ඉඳි ආනයනය සහ බෙද හැරීම (විදේශීය)		13	1,000,000	19,810,600	-	20,810,600	-	-	-	20,810,600	100	තීරුබදු ගාස්තු 1409-0-13 ගෙවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වීම.
එකතුව (ඈ)			57,450,000	46,375,800	(7,205,000)	96,620,800	52,394,791	2,310,791	54,705,582	41,915,218		
අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා මුළු වියදම (අ+ආ+ඇ+ඈ)			71,750,000	46,375,800	(7,655,000)	110,470,800	60,954,751	2,515,503	63,470,254	47,000,546		
වැය විෂය අනුව වගරීකරණය කරන ලද මාරුකිරීම්, ප්‍රදානයන් සහ සහනාධාර	7											
මාරුකිරීම්												
1506 - රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී		11	50,000	-	-	50,000	-	-	-	50,000	100	දේපළ ණය ලබාගත් නිලධාරීන් වර්ෂය තුල වාර්තා නොවීම.
එකතුව			50,000	-	-	50,000	-	-	-	50,000		
පොළී ගෙවීම්												
වෙනත් පුනරාවතර්න වියදම්	9											
010-1501 - සුභශාධන වැඩසටහන්		11	30,000,000	-	-	30,000,000	30,000,000	-	30,000,000	-	-	
1703 - රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම		11	200,000	-	(25,000.00)	175,000	36,000	-	36,000	139,000.00		වෙනත් ආයතනයක පවත්වන ලද රාජ්‍ය භාෂා පුහුණුව සඳහා නිලධාරීන් දෙදෙනෙකු යවා ඇති අතර අදළ වියදම් එම ආයතනය විසින් දරා ඇත.
එකතුව			30,200,000	-	(25,000.00)	30,175,000	30,036,000	-	30,036,000	139,000.00		
වැඩසටහන (2)												
මුළු පුනරාවතර්න වියදම්වල එකතුව (සටහන 5-9)			179,000,000	46,375,800	-	225,375,800	173,719,694	3,275,878	176,995,572	48,380,228		
මූලධන වියදම්												

ඒසීඒ-2(ii)

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 202

දෙපාර්තමේන්තුවේ නම : මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

රු.

වැය විෂයය	සටහන	මූල්‍ය සංකේත අංකය	ප්‍රතිපාදනය				වියදම			ශුද්ධ මිලදැමීම		
			වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන	මු.රෙ. 66/69 මාරු කිරීම	මුළු ශුද්ධ ප්‍රතිපාදන	මුදල් පොතට අනුව වියදම	මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම (භාණ්ඩාගාර මුද්‍රිත පටහන් අනුව)	මුළු වියදම	ඉතිරිය / (ඉක්මවීම)	ඉතිරිය / (ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස	වෙනස්කම්වලට හේතු
වැඩසටහන (2)												
වැය විෂය අනුව රාජ්‍ය ආයෝජන වර්ගීකරණය												
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	10											
2001 - ගොඩනැගිලි සහ ඉදිකිරීම්		11	1,000,000	-	-	1,000,000	798,000	-	798,000	202,000	20	ඉදිරි අවශ්‍යතා සපුරාලීම සඳහා ඉතිරි ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම
2002 - පිරියත, යන්ත්‍රෝපකරණ හා උපකරණ		11	800,000	-	-	800,000	687,125	-	687,125	112,875	14	අතියම් ඉතුරුම්
2003 - වාහන		11	1,600,000	-	-	1,600,000	1,463,342	-	1,463,342	136,658	9	අතියම් ඉතුරුම්
එකතුව (අ)			3,400,000	-	-	3,400,000	2,948,467	-	2,948,467	451,533		
මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11											
2102 - ලී බඩු හා කාර්යාලීය උපකරණ		11	1,500,000	-	-	1,500,000	917,749	124,100	1,041,849	458,151	31	2025 දෙසැම්බර් මස ප්‍රසම්පාදන කටයුතු සිදු කළද ලංගු නොලැබීම
2103 - පිරියත, යන්ත්‍රෝපකරණ හා උපකරණ		11	600,000	-	-	600,000	525,000	-	525,000	75,000	13	ඉදිරි අවශ්‍යතා සපුරාලීම සඳහා ඉතිරි ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම.
එකතුව (ආ)			2,100,000	-	-	2,100,000	1,442,749	124,100	1,566,849	533,151		
ප්‍රාග්ධන මාරුකිරීම්	12											
06-2205 - රාජ්‍ය නොවන ආයතන සඳහා ප්‍රාග්ධන ප්‍රදානයන් (දහම් පාසල් සඳහා පහසුකම් ලබා දීම)		11	10,000,000	-	-	10,000,000	-	9,934,874	9,934,874	65,126	1	
07-2205 - රාජ්‍ය නොවන ආයතන සඳහා ප්‍රාග්ධන ප්‍රදානයන් (ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන ඉදි කිරීම)		11	15,000,000	-	-	15,000,000	-	13,221,254	13,221,254	1,778,746	12	අයහපත් කාලගුණය හේතුවෙන් ව්‍යාපෘති කීපයක් සම්පූර්ණ කළ නොහැකි වීම.
එකතුව (ඇ)			25,000,000	-	-	25,000,000	-	23,156,128	23,156,128	1,843,872		
හැකියා වර්ධනය	14											
2401 - කාර්ය මණ්ඩල පුහුණු		11	500,000	-	-	500,000	488,415	-	488,415	11,585		
එකතුව (ඈ)			500,000	-	-	500,000	488,415	-	488,415	11,585		
අනෙකුත් ප්‍රාග්ධන වියදම්	15		-	-	-	-	-	-	-	-		
වැඩසටහන (2)												
රාජ්‍ය ආයෝජනයේ මුළු වියදම (අ+ආ+ඇ+ඈ)			31,000,000	-	-	31,000,000	4,879,631	23,280,228	28,159,859	2,840,141		
මුළු වියදම්වල එකතුව (සටහන 5-15)			210,000,000	46,375,800	-	256,375,800	178,599,326	26,556,106	205,155,432	51,220,368		

* අදාළ වැය විෂයයන් පමණක් ඇතුළත් කර ආකෘතිය සංශෝධනය කර ගත යුතු ය.

එස්.එල්.එම්. නිබ්රාස්
ගණකාධිකාරී
දිනය : 23.02.2026

එස්.එල්.එම්. නිබ්රාස්
ගණකාධිකාරී
මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
කොළඹ 10.

අක්මුදල්

ඇමු-3

2025 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

දෙපාර්තමේන්තුවේ නම : මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු
වියදම් ශීර්ෂ අංකය : 202

රු.

අග්‍රිම ගිණුම් අංකය	2025 ජනවාරි 01 දිනට අග්‍රිම ශේෂය 1			අග්‍රිම ලැබීම් 2			අග්‍රිම පියවීම 3			2025 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය 4			2025 දෙසැම්බර් 31 දිනට ආයතන පොත් අනුව ශේෂය	2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය
	නොපියවූ උප අග්‍රිම	නොපියවූ අග්‍රිම (නොපියවූ උප අග්‍රිම හැර)	එකතුව	භාණ්ඩාගාරයෙන්	වෙනත් මූලාශ්‍රවලින්	එකතුව	වියදම් මගින්	මුදල් මගින්	එකතුව	නොපියවූ උප අග්‍රිම ශේෂය	නොපියවූ අග්‍රිම ශේෂය	එකතුව	*5	6
	1(i)	1(ii)	1(iii)	2(i)	2(ii)	2(iii)=2(i)+2(ii)	3(i)	3(ii)	3(iii)=3(i)+3(ii)	4(i)	4(ii)	4(iii)=4(i)+4(ii)	5=1(iii)+2(iii)-3(iii)	
7002/135/25		-	-	178,315,000	5,803,916	184,118,916	184,077,916	41,000	184,118,916	-	-	-	-	41,000

1. ඉහත 4 හා 6 ශේෂ අතර වෙනසට හේතු පෙන්වන්න
   (1) ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන 2025.12.31 දිනට මුදල් ශේෂය ....
   (2) වෙනත් හේතු - ....

මෙම ශේෂ වාර්තාව අත්සන් කරන දින වන විට පියවා ඇත්නම් ඒ බව ද, නොඑසේ නම් නොපියවීමට හේතු සඳහන් කරන්න.
ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

....
එස්.එල්.එම්. නිබ්රාස්
ගණකාධිකාරී
දිනය : 23.02.2026

එස්.එල්.එම්. නිබ්රාස්
ගණකාධිකාරී
මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
කොළඹ 10.

* මෙම ශේෂය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි පෙන්විය යුතු ය.

තැන්පත් කිරීම්

ඊසිර් -4

2025 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීෂර් අංකය : 202 දෙපාතර්මේන්තුවේ නම : මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු

රු.

තැන්පතු ගිණුමේ නම	තැන්පතු අංකය	2025 ජනවාරි 01 දිනට ශේෂය	වර්ෂය තුළ බැර කිරීම්	වර්ෂය තුළ හර කිරීම්	2025 දෙසැම්බර් 31 දිනට ශේෂය	2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය
ටෙන්ඩර් තැන්පත්	6000-0-0-002-0-148-0	35,000	50,000	70,000	15,000	15,000
ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම්	6000-0-0-18-0097	73,376	584,033	562,409	95,000	95,000
		108,376	**634,033**	**632,409**	**110,000**	**110,000**

....
එස්.එල්.එම්. නිබ්රාස්
ගණකාධිකාරී
දිනය : 23.02.2026

එස්.එල්.එම්. නිබ්රාස්
ගණකාධිකාරී
මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු
දෙපාර්තමේන්තුව
කොළඹ 10.

අත්තිකාරම් ගිණුම්

ඊසිර්- 5

2025 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීෂර් අංකය : 202 දෙපාතර්මේන්තුවේ නම : මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු

රු.

අත්තිකාරම් ගිණුමේ නම	අත්තිකාරම් ගිණුම් අංකය	2025 ජනවාරි 01 දිනට ශේෂය	වියදමෙහි උපරිම සීමා රු.3,000,000.00		ලැබීම්වල අවම සීමා රු. 1,500,000.00		හර ශේෂයන්ගේ උපරිම සීමා රු.10,000,000.00	බැරකම් පිළිබඳ උපරිම සීමා රු.	2025 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය
			වර්ෂය තුළ හර කිරීම්		වර්ෂය තුළ බැර කිරීම්		ශේෂය		
		(1)	(2)		(3)		4=(1)+(2)-(3)		
			මුදලින්	හරස් සටහන් මගින්	මුදලින්	හරස් සටහන් මගින්			
(1) රජයේ නිලධාරින්ගේ අත්තිකාරම්	8493/0/0/0202/0011	5,720,894	2,988,601	35,219	109,994	1,814,392	**6,820,327.93**	-	**6,820,328**
	8493/0/0/0202/0012	-	-		-	575,050	**(575,050)**	-	**(575,050)**
(2) අනෙකුත් අත්තිකාරම්									
		5,720,894	**2,988,601**	**35,219**	**109,994**	**2,389,442**	**6,245,278**	-	**6,245,278**

සටහන: අත්තිකාරම් B ගිණුමට වැරදීමකින් බැර කරන ලද රු.35,219 ක ණය පොලී අයකර ගැනීම 2025 සැප්තැම්බර් මාසයේදී නිවැරදි කරන ලදී.
මෙම ගැලපුම හේතුවෙන් වර්ෂය සඳහා වූ හර ශේෂය රුපියල් මිලියන 3 ඉක්මවිය.

....
එස්.එල්.එම්. නිබ්රාස්
ගණකාධිකාරී
දිනය : 23.02.2026

එස්.එල්.එම්. නිබ්රාස්
ගණකාධිකාරී
මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු
දෙපාර්තමේන්තුව
කොළඹ 10.

මූල්‍ය රෙගුලාසි 208 ප්‍රකාරව අනෙකුත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත පළාත් සභාව/ ප්‍රතිපාදන වැය සඳහා වෙන්කළ මුදල් (.රු)

අනු අංකය	මුදල් ලැබුණේ කිනම් දෙපාර්තමේන්තු වෙන්ද/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන්ද	මුදල් වෙන් කිරීමේ අරමුණ	වෙන් කළ මුදල		තථ්‍ය වියදම	අවසන් වෙන් කළ මුදලේ % ලෙස වෙන් කළ මුදල් උපයෝජනය
			මුල්	අවසාන		
01	දුම්රිය දෙපාර්තමේන්තුව	කාර්ය මණ්ඩලය සඳහා දුම්රිය බලපත්‍ර	1,000,000.00	1,000,000.00	760,375.00	76.03%
02	**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය** කළුතර ගම්පහ ත්‍රිකුණාමලය නුවරඑළිය හම්බන්තොට කෑගල්ල මඩකලපුව යාපනය මන්නාරම කිලිනොච්චිය අම්පාර මහනුවර ගාල්ල මුලතිවු මාතර අනුරාධපුර පොළොන්නරුව කුරුණෑගල පුත්තලම වවුනියාව	කාර්ය මණ්ඩල ලිපි ද්‍රව්‍ය වියදම්	205,000.00	205,000.00	204,711.75	99.85%
03	**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය** හම්බන්තොට	ජාතික මිලාද් නබි උත්සවයට අදාළ වියදම්	2,500,000.00	2,500,000.00	2,310,791.42	92.43%
04	**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය** අම්පාර	කාර්යමණ්ඩල ලී බඩු සහ කාර්යාල උපකරණ වියදම	130,000.00	130,000.00	124,100.00	95.46%
05	**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය** කළුතර ගම්පහ ත්‍රිකුණාමලය නුවරඑළිය කෑගල්ල මඩකලපුව	මුස්ලිම් පල්ලි සහ ආගමික ස්ථාන සංවර්ධන ව්‍යාපෘති	15,000,000.00	15,000,000.00	13,221,254.07	88.14%

	යාපනය මන්නාරම අම්පාර මහනුවර ගාල්ල මුලතිවු මාතර අනුරාධපුර පොළොන්නරුව කුරුණෑගල පුත්තලම වවුනියාව					
06	**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය** හම්බන්තොට	ජාතික මිලාද් නබි උත්සවයට අදාළ මුස්ලිම් පල්ලි සංවර්ධන ව්‍යාපෘති	10,000,000.00	10,000,000.00	9,934,873.82	99.34%

3.2 ප්‍රතිපාදන උපයෝජනයේ කාර්යසාධනය

වෙන් කළ මුදල් වර්ගය	වෙන් කළ මුදල		තථ්‍ය වියදම	අවසන් වෙන් කළ මුදලේ % ලෙස වෙන් කළ මුදල් උපයෝජනය
	මුල්	අවසාන		
පුනරාවර්තන	179,000,000	179,000,000	176,995,572.37	**99%**
ප්‍රාග්ධන	31,000,000	31,000,000	28,159,859.22	**91%**
මුළු ආදායම	**210,000,000**	**210,000,000**	**205,155,431.59**	**98%**

3.3 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

මෙම දෙපාර්තමේන්තුව සේවා සපයන ආයතනයකි.

(රු.)

ආදායම් කේතය	ආදායම් කේතය පිළිබඳ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතුකළ ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසාන ඇස්තමේන්තුව	මුදල (රු.)	අවසාන ආදයම් ඇස්තමේන්තුවේ % ලෙස
2002-02-99	වෙනත්	-	-	223,728.64	
2003-99-00	වෙනත් ලැබීම්	-	-	940,529.35	
2004-01-00	මධ්‍යම රජය	-	-	4,331,547.66	
මුළු ආදායම		-	-	**5,495,805.65**	

3.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය (රු.)

වත්කම් කේතය	කේත විස්තරය	භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව 2025.12.31 දිනට ශේෂය	2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	තවමත් ගිණුම් ගත කිරීමට තිබෙන	වාර්තාකිරීමේ ප්‍රගතිය %ක් ලෙස
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	312,485,000.00	312,485,000.00	0.00	100
9152	යන්ත්‍ර හා උපකරණ	48,119,275.85	48,119,275.85	0.00	100
9153	භූමිය				
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීවවිද්‍යාත්මක වත්කම්				
9160	නොනිමි වැඩ				
9180	කල්බදු වත්කම්				

3.5 විගණකාධිපතිවරයාගේගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිඑඑ/සී/ඩීඑම්ආර්/2/2026/18 — ඔබේ අංකය / உமது இல. / Your No. } — දිනය / திகதி / Date } 2026 ජූනි

අධ්‍යක්ෂ
මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

ශීර්ෂය 202 - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යථෝක්ත වාර්තාව හා විගණිත මූල්‍ය ප්‍රකාශනවල පිටපතක් මේ සමඟ එවමි.

කේ.එච්.යූ.ඩී.සරත් කුමාර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් - 01. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

02. ලේකම් - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය - කා.දැ.ස

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

CS Scanned with CamScanner

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.: සිඑජ්/සී/ඩීඑම්ආර්/2/2026/18
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2026 ජුනි 13 දින

අධ්‍යක්ෂ
මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

ශීර්ෂය 202 - මුස්ලිම් ආගමික හා සංස්කෘතික දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 202 - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ

සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූලධන වියදම්

(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ , අයෝජන ක්‍රියාකාරකම් සඳහා වන මුදල් වැයකිරීම් යටතේ වන මූලධන වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් අයෝජන අත්පත් කර ගැනීමේ වියදම රු.1,442,749ක් වුවද රු.4,879,431 ක් ලෙස රු.3,436,882ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සඳහා දරණ ලද රු.2,948,467ක හා හැකියා වර්ධනය සඳහා දරණ ලද රු.488,415ක එකතුව රු.3,436,882ක් වූ වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකරකම් සඳහා මුදල් වැයකිරීම් යටතේ දක්වා නොතිබුණි.

CS Scanned with CamScanner

1.6.2 මූල්‍ය නොවන වත්කම්

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරන ලද මුළු වියදම, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ (ඒසීඒ- 6 ආකෘතියේ) වර්ෂයේ මිලදී ගැනීම්වල වටිනාකමට සමාන විය යුතු වුව ද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම යටතේ වැය කරන ලද මුදල රු. 1,566,849 ක් ලෙස දක්වා තිබුණු අතර, ACA 6 ආකෘතියේ එය රු. 1,442,749 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු. 124,100 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.3 අග්‍රිම ශේෂය

ACA 3 ආකෘතිය අනුව 2025 දෙසැම්බර් 31 දිනට ආයතන පොත් අනුව අග්‍රිම ශේෂය සහ භාණ්ඩාගාර පොත් අනුව ශේෂය අතර රු.41,000ක වෙනසක් පැවතුණ අතර එම වෙනසට හේතු වූ ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන 2025 දෙසැම්බර් 31 දිනට වූ මුදල් ශේෂය ACA 3 ආකෘතිය තුළ දක්වා නොතිබුණි.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

	ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(අ)	වාහන ලොග් සටහන් පොත්	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1645(අ)	යාවත්කාලීනව පවත්වා නොතිබුණි
(ආ)	වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ 1647 (ඉ)	පවත්වා නොතිබුණි

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශය ක්‍රියාත්මක කර තිබුණි.

CS Scanned with CamScanner

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්තන වැය විෂයයන් 10ක් හා මූලධන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදිත එකතුව රු.11,575,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.5,938,790ක් ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 31 සිට සියයට 95 දක්වා පරාසයක පැවතුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් දෙකක් සඳහා ප්‍රතිපාදිත රු.10,370,000 ක් වූ සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඇ) 202-2-1-11-1409-0-13 පුනරාවර්තන වැය විෂයය යටතේ රට ඉඳි ආනයනය සහ බෙදා හැරීම වෙනුවෙන් රු.1,000,000 ක වාර්ෂික අයවැයගත ප්‍රතිපාදනයට අමතරව 2025 ජනවාරි 06 දින පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් රු.19,810,600 ක ප්‍රතිපාදන වෙන් කරවා ගෙන රු.20,810,600 ක් වූ සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් 6ක් සඳහා මූලික වියදම් ඇස්තමේන්තු ප්‍රතිපාදනය සියයට 30 සිට සියයට 1981 දක්වා පරාසයක ප්‍රතිශතයකින් සංශෝධනය කර තිබුණි.

3.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. (අදාල සහතිකවීම පිළිබඳ ප්‍රකාශනයක් 2025 වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳව ප්‍රකාශයනට පහළින් ඇතුලත් කර ඇත)

(ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිතයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 4.1.2 (අ) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.

(ඇ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.4 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

CS Scanned with CamScanner

(ඇ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

සම්මත පරිදි නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ	
(i) මුදල් රෙගුලාසි 756(6) අනු අංක 01	2025 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත් කිරීම 2025 දෙසැම්බර් 15 දිනට පෙර සිදු කළ යුතු වුවත් අදාල පත් කිරීම 2026 පෙබරවාරි 03 දින සිදු කර තිබුණි.
(ii) මුදල් රෙගුලාසි 756(6) අනු අංක 05	පොදු 47 වාර්තාවෙහි සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් 2026 වර්ෂයේ අප්‍රේල් 30 දිනට පෙර සුදුසු පරිදි කටයුතු කළ යුතු වුවත් අදාල කටයුතු 2026 මැයි 13 දින වන විටත් සිදු කර නොතිබුණි.
(ආ) මුදල් රෙගුලාසි 1646	268 (අ)පොදු ආකෘති පත්‍රයේ ලියන ලද ගමන් පිළිබඳ දෛනික ධාවන සටහන්, වාහන භාර නිලධාරින් වාර්තා ඉදිරිපත් කරන මාසයට පසු ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථමයෙන් මාසික සාරාංශයේ මුල් පිටපත සමඟ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2025 වර්ෂයට අදාළව වාහන 06ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඇ) අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් ප්‍රකාශිත මුදල් රෙගුලාසි 876 (3)	දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන හප් අරමුදල පාර්ලිමේන්තුවේ පනතක් මඟින් නීත්‍යානුකූලව පිහිටුවා නොතිබුණු අතර චක්‍රලේඛ ප්‍රකාරව අරමුදල පවත්වාගෙන යාමේ නීත්‍යානුකූල තත්ත්වය ලබා ගැනීම උදෙසා හප් පනත සම්මත කර ගැනීමේ කටයුතු අවසන් වී නොතිබුණි.
(ඇ) අංක 02/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය	ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කර ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගත යුතු වවුද, 2025 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

CS Scanned with CamScanner

3.4 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

(අ) මුදල් රෙගුලාසි 371(2) (ආ) ප්‍රකාරව තත්ත්කාර්ය අතුරු අග්‍රිමය ලබා ගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවත් අවස්ථා 6කදී එකතුව රු.382,600ක් වූ අතුරු අග්‍රිම පියවීමට දින 14 සිට 28 දක්වා කාල ප්‍රමාදයක් සිදු වී තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 372 (2) (ආ) ප්‍රකාරව මාණ්ඩලික නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්ත්කාර්ය අතුරු අග්‍රිම ලබා දිය හැකි වුවත් ඊට පටහැනිව රු.300,000ක අතුරු අග්‍රිමයක් ඉන්ධන ලබා ගැනීම සඳහා පෞද්ගලික ආයතනයකට ලබා දී තිබුණි.

(ඇ) අත්තිකාරම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගැනීම සිදු කර නොතිබුණු අතර අත්තිකාරම් ලබා ගත් පුද්ගලයාගේ අත්සන, අත්තිකාරම් ලබා දුන් නිලධාරියාගේ අත්සන, වවුචර අංකය යනාදී සම්පූර්ණ තොරතුරු ලේඛනයෙහි ඇතුළත් කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව තම ආයතනය වෙනුවෙන් සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන් දීමේ නිළධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු වුවද, 2025 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම සඳහා අමාත්‍යංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා දී තිබුණේ 2025 ජනවාරි 23 දින වේ.

4.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

(අ) 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47 (4) උපවගන්තිය ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතු වුවත් 2024 වර්ෂයේ කාර්යසාධන වාර්තාව 2025 අගෝස්තු 25 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි.

(ආ) 2025 කාර්යසාධන වාර්තාවේ ඇතුළත් අනුකූලතා වාර්තාව අනුව දෙපාර්තමේන්තුව විසින් අනුකූල වී නොමැති පහත කරුණු සම්බන්ධයෙන් අනුකූල වන බව වාර්තා කර තිබුණි.

CS Scanned with CamScanner

i. වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.
ii. විගණකාධිපති විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.
iii. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කර නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
iv. වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
v. ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන් ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.

4.2 වත්කම් කළමනාකරණය

(අ) 2025 මැයි මස 05 දින සිට ධාවනයේ යොදවා නොතිබීමෙන් නිශ්කාර්යව පැවතුණ දෙපාර්තමේන්තුවට අයත් මෝටර් රථයක් ප්‍රවාහන නිලධාරිගේ 2025 ඔක්තෝබර් 07 දිනැති ලිපිය අනුව අලුත්වැඩියා කළ යුතු යැයි හඳුනාගෙන තිබුණි. මෙම අලුත්වැඩියා කිරිමට අදාලව තාක්ෂණ නිලධාරී විසින් පරීක්ෂා කර නිර්දේශ ලබා දුන් බවට හෝ අලුත්වැඩියා කිරීමට අදාල මිල ගණන් කැඳවූ බවට හෝ අලුත්වැඩියාවට සම්බන්ධ කිසිදු තොරතුරක් ගොනුව තුළ අන්තර්ගත නොවුණද ධාවන සටහන් අනුව අලුත්වැඩියා කිරීමෙන් පසු අදාල රථය 2026 පෙබරවාරි මාසය තුළ කිලෝ මීටර 1177ක සැලකිය යුතු දුරක් ධාවනය කිරීමත් 2026 මාර්තු 19 දාතමින් අලුත්වැඩියා කිරිමට අදාල මිල කැඳවීම් ලිපියක් ඉදිරිපත් වීමත් මත අලුත්වැඩියාවට සම්බන්ධ කටයුතු විනිවිදභාවයකින් සිදු වූ බවට තහවුරු නොවුණි.

(ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සෑම ඉන්ධන පරික්ෂාවකටම පසු මාස 12ක කාල සීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ වාහන 6ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව, රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය අනුව හා 2019 නොවැම්බර් 28 දිනැති අංක 07/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම පරිදි ඇප තැබිය යුතු සියලුම නිලධාරීන්ගෙන් ඇප මුදල් අය කළ යුතු වුවද, ඇප තැබිය යුතු සියලුම නිලධාරීන්ගෙන් ඇප මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.4 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

2025 වර්ෂයේ දී විගණකාධිපති විසින් නිකුත් කරන ලද එක් විගණන විමසුමක් සඳහා පිළිතුරු ලබා දීමට කටයුතු කර නොතිබුණි.

CS Scanned with CamScanner

4.5 කළමනාකරණ දුර්වලතා

2025 වර්ෂයේ මුස්ලිම් සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම හා පල්ලි වැඩි දියුණු කිරීම වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 23 ක පල්ලි 37 ක් සඳහා රු.15,000,000ක ප්‍රතිපාදන ලබා දී තිබුණ අතර මෙහිදී සංවර්ධනය සඳහා පල්ලි තේරීම සිදුකළ කමිටුව විසින් නිර්දේශ කරන ලද පල්ලි සඳහා අනුමැතිය ලබා දී තිබියදී ඉන් එක් පල්ලියක් හේතු දැක්වීමකින් තොරව ඉවත් කර එලෙස අනුමැතිය ලබා දුන් දිනට පසු දිනක ඉල්ලීම සිදුකළ වෙනත් පල්ලියක් වෙනුවෙන් අවස්ථාව ලබා දීමත්, සංවර්ධනය සඳහා නිර්දේශ කරන ලද පල්ලියක් සඳහා ප්‍රතිපාදන නිදහස් නොකිරීමත් නිර්දේශ ලබා නොදුන් පල්ලි සඳහා ප්‍රතිපාදන ලබා දීමත්, ප්‍රමුඛතාවය මත එක් දිස්ත්‍රික්කයකින් පල්ලි 2ක් බැගින් තෝරා ගැනීමට උපදෙස් ලබාදී තිබුණද ඇතැම් දිස්ත්‍රික්කවලින් එක් පල්ලියක් සහ තවත් දිස්ත්‍රික්කවලින් පල්ලි තුනක් බැගින් තේරීම කිරීමත් යනාදී ලෙස ව්‍යාපෘතිය සඳහා පල්ලි තේරීමේද අවිධිමත් ආකාරයෙන් කටයුතු කර තිබුණි.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරියා විසින් එම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම පිණිස සුදුසු විගණකවරයෙකු පත් කරනු ලැබිය යුතු වුවද, 2015 වර්ෂයේ ඇති කර තිබූ අභ්‍යන්තර විගණක තනතුර මෙම වාර්තාවේ දිනය වන විටත් පුරප්පාඩු වී පැවතුණි.

5.2 විගණන හා කළමනාකරණ කමිටුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වන වගන්තියේ විධිවිධාන පරිදි සෑම අස්ථිත්වයක් සඳහාම විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් විධිමත් පරිදි විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 123ක් වුවද, තථ්‍ය කාර්ය මණ්ඩලය 106ක් වූ අතර ඒ තුළ සංවර්ධන නිලධාරීන් තිදෙනෙකුගේ අතිරික්තයක් සහ සෙසු නිලධාරීන් 20 කගේ පුරප්පාඩු පැවතුණි.

CS Scanned with CamScanner

(ආ) 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 05ක් එකම සේවා ස්ථානයෙහි සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩ දීම සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත් දෙපාර්තමේන්තුව තුල වසර 05 ඉක්මවා සේවයේ නිරත නිලධාරීන් සංඛ්‍යාව 44 ක් වූ අතර ඉන් නිලධාරීන් 3 දෙනෙකු වර්ෂ 20ට වැඩි කාලයකුත් තවත් නිලධාරීන් 21 දෙනෙකු වර්ෂ 10කට වැඩි කාලයකුත් දිගින් දිගටම එකම සේවා ස්ථානය තුළ සේවයේ නිරත බව නිරීක්ෂණය විය.

කේ.එච්.යූ.ඩී. සරත් කුමාර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

CS Scanned with CamScanner

පර්ච්ඡේදය 04 — කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (කියාකාරී සැළසුම් මත පදනම්ව)

විශේෂ දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	75%-89%	50%- 74%
මුස්ලිම් සමාජයේ සමගිය පෝෂණය කිරීම සහ ජාතික ඒකාබද්ධතාව සඳහා කටයුතු කිරීම.	√		
ශුද්ධ වූ මිහරාජ් දිනයේ වටිනාකම් සහ යහපත් ගුණාංග ඉස්මතු කර දැක්වීම.	√		
ඉස්ලාමීය ආගමික වතාවත් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම.			√
මුස්ලිම්, බෞද්ධ, හින්දු සහ ක්‍රිස්තියානුවන් සඳහා මුහම්මද් නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාගේ චරිත පිළිබඳ දැනුවත් කිරීම.		√	
මුස්ලිම් පල්ලි, අරාබි විද්‍යාල, අහදිය දහම් පාසල් සහ සංස්කෘතික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම.	√		
අහදියා පාසල් ගුරුවරුන් දිරිගැන්වීම සහ අල් කුර්ආන් මද්‍රසා සඳහා අවශ්‍ය මූලික පහසුකම් සලසමින් දිරිමත් කිරීම.		√	
ඉස්ලාමීය අධ්‍යාපනය වැඩි දියුණු කිරීම.			√
මද්රසා(අරාබි පාසල්) ප්‍රතිසංස්කරණය කිරීම.			√
නවක මුස්ලිම් ලේඛකයින් හඳුන්වා දීම හා දිරිගැන්වීම.		√	
වකුෆ් පනතට අනුකූලව සියලුම මුස්ලිම් පල්ලි සහ පුණ්‍යාභාර පරිපාලනය සඳහා පහසුකම් හා සේවා සැපයීම.	√		
නිලධාරින්ගේ දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම		√	

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
4. අරමුණු, පරිපූර්ණ, සාධාරණ හා ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	4.1 2030 වන විට ඵලදායි ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් නිදහස්, සමාන හා ගුණාත්මකභාවයෙන් ඉහළ සහ ද්වීතියික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම.	4.1.1 ස්ත්‍රී පුරුෂ භාවය අනුව (අ) 2/3 ශ්‍රේණි, (ආ) ප්‍රාථමික ශ්‍රේණි අවසානයේ සහ (ඇ) පහළ ද්විතීයික මට්ටම් වල ඉගෙනුම ලබන දරුවන් සහ යෞවනයන් අතර 1. කියවීමට සහ 11. ගණිතමය කුසලතාවය සඳහා වන අවම මට්ටම සහිත අයගේ ප්‍රමාණය		√	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ සහ අභියෝග

2030 න්‍යාය පත්‍රය සඳහා වූ තිරසාර සංවර්ධන ඉලක්ක ගෝලීය ක්‍රියාවක් වන අතර එක්සත් ජාතීන් සිය සාමාජික රටවල් සඳහා තිරසාර සංවර්ධන ඉලක්ක 17 ක් හඳුන්වා දී ඇත. මෙම සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ විවිධ සංවර්ධන කටයුතු සිදු කෙරේ. තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහ මෙම දෙපාර්තමේන්තුව මුස්ලිම් පල්ලිවල ස්වරූපයෙන් උරුමයන් සුරැකීමෙන් සහ ජාතික මට්ටමේ ආගමික හා සංස්කෘතික කටයුතු සංවිධානය කිරීමෙන් හා පහසුකම් සැලසීමෙන් තිරසර සංවර්ධනය සඳහා දායක වේ.

අභියෝග

- මුස්ලිම් පල්ලි හා සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණයට සහ කලා හා සංස්කෘතික වැඩසටහන් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය

විස්තරය	අනුමත සේවක සංඛ්‍යාව	සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු/ (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ මට්ටම	**09**	**04**	**05**
අධ්‍යක්ෂ	01	01	-
ගණකාධිකාරී	01	01	-
අභ්‍යන්තර විගණක (ශ්‍රීලගසේ)	01	-	01
නියෝජ්‍ය/ සහාකාර අධ්‍යක්ෂ (ශ්‍රීලපසේ)	04	02	02
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ශ්‍රීලපසේ නොවන)	02	-	02
තෘතීයික මට්ටම	**04**	**00**	**04**
පරිපාලන නිලධාරී	01	-	01
භාෂා පරිවර්තක	01	-	01
වකුෆ් මණ්ඩල ලේකම්	01	-	01
වකුෆ් විනිශ්චය සභා ලේකම්	01	-	01
ද්විතියික මට්ටම	**93**	**87**	**06**
සංවර්ධන නිලධාරී	71	74	(- 03)
කළමනාකරණ සේවා නිලධාරි	22	13	09
ප්‍රාථමික මට්ටම	**17**	**15**	**02**
රියදුරු	04	03	01
කා.කා.ස.	13	12	**01**
එකතුව	**123**	**106**	**17**

6.2 මානව සම්පත් හිඟය ආයතනයේ කාර්යසාධනය කෙරෙහි බලපා ඇති ආකාරය.

මානව සම්පත් සංවර්ධනය, කාර්ය සාධනය සහ ජයග්‍රහණ දෙපාර්තමේන්තුවට ඉතා වැදගත් වේ. දෙපාර්තමේන්තු නිලධාරීන් දෙපාර්තමේන්තුවේ කොඳු නාරටිය වන බැවින් ජ්‍යෙෂ්ඨ මට්ටම, ප්‍රාදේශීය මට්ටම, ද්විතියික මට්ටම සහ ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලයේ හිඟය දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වයට බෙහෙවින් බලපානු ඇත. විශේෂයෙන්ම ආයතනික ධුරාවලිය තුළ තීරණ ගැනීමට සිදුවන අවස්ථා සහ මූල්‍ය බලතල වැනි වගකීම් භාර ගැනීමට මෙන්ම මගපෙන්වීම සහ විධිමත් කිරීමට පහසුකම් සැලසිය යුතු අවස්ථාවන්හිදී මාණ්ඩලික නිලධාරීන්ගේ හිඟය ප්‍රායෝගික ගැටලු මතුකර තිබේ. . සේවක හිඟය පිළිබඳ තොරතුරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට දන්වා පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස ඉල්ලීම් කර ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
1	නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පුහුණු වැඩසටහ(මාණ්ඩලික නිලධාරි)	01	පැය 06	95000.00	-	දේශීය	දැනුම හා කුසලතා ලබා ගැනීම
2	නව පොදු ප්‍රසම්පාදන මාරගෝපදේශ පුහුණුව	07	දින 06		-	දේශීය	දැනුම හා කුසලතා ලබා ගැනීම
3	පොදු වත්කම් කළමනාකරනය	05	පැය 06	62500.00	-	දේශීය	
4	මුල්‍යා වාර්තා සකස් කිරීමේ පුහුණුව	03	පැය 06		-	දේශීය	දැනුම හා කුසලතා ලබා ගැනීම
5	ඒඅයි පුහුණුව	09	පැය 12	62000.00	-	දේශීය	දැනුම හා කුසලතා ලබා ගැනීම
6	MS word සමග වෘත්තීය ලේඛන සකස් කිරීම් පිළිබඳ පුහුනුව	02	පැය 06	13000.00	-	දේශීය	දැනුම හා කුසලතා ලබා ගැනීම
7	ආචාර ධර්ම හා විනය සම්බන්ධ වැඩමුළුව	02	පැය 06	13000.00		දේශීය	දැනුම හා කුසලතා ලබා ගැනීම
8	තොරතුරු පද්ධති විසඝනය කිරීම් පුහුණු පාඨමාලාව	01	පැය 06	14000.00		දේශීය	දැනුම හා කුසලතා ලබා ගැනීම
9	උසස් ms excel 03 කුසලතා පිළිබඳ වැඩමුළුව	02	පැය 06	26000.00		දේශීය	දැනුම හා කුසලතා ලබා ගැනීම
10	ආචාර ධර්ම හා විනය සම්බන්ධ වැඩමුළුව	01	පැය 06	6000.00		දේශීය	දැනුම හා කුසලතා ලබා ගැනීම
11	ලංසු ඇගයීම පුහුණුව	02	පැය 06	28000.00		දේශීය	දැනුම හා කුසලතා ලබා ගැනීම
12	මුල්‍යා ප්‍රකාශනය පිළිබඳ පුහුණුව	01	පැය 06	14000.00		දේශීය	දැනුම හා කුසලතා ලබා ගැනීම
13	අවදානම් මත පදනම්වූ අභ්‍යාන්තර විගණන සැලසුම් සඳහා පුහුණුව	01	පැය 06	15000.00		දේශීය	දැනුම හා කුසලතා ලබා ගැනීම
14	ගිණුම්කරණ පුහුණු වැඩසටහන	01	පැය 06	15000.00		දේශීය	දැනුම හා කුසලතා ලබා ගැනීම
15	අභ්‍යන්තර විගණන භාවිතයට අදාල පුහුනුව	01	පැය 06	15000.00		දේශීය	දැනුම හා කුසලතා ලබා ගැනීම
16	පුද්ගිලක ලිපිගොනු හා වැටුප් පරිවර්තනය අදාල පුහුනුව	03	පැය 12	45000.00		දේශීය	දැනුම හා කුසලතා ලබා ගැනීම

*** කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන ආයතනයේ කාර්ය සාධනයට දායක වේ.**

ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් නිලධාරීන්ගේ උපරිම මට්ටමින් ඔවුන්ගේ ධාරිතාව ඉහළ නැංවීමට සහාය වී ඇත. ඒ අතරම, බොහෝ ව්‍යාපෘති පහසුවෙන් සංවිධානය කිරීමට සහාය වන

කාර්ය මණ්ඩලය අතර කණ්ඩායම් ගොඩනැගීම ද වර්ධනය විය. එබැවින් ධාරිතා වර්ධනය සේවා ලාභින් තෘප්තිමත් කරනු ලැබේ. එබැවින් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාත්මක කරමින් දෙපාර්තමේන්තු කාර්ය සාධනය සාක්ෂාත් කර ගැනීමට නිලධාරීන් දායක වේ.

පරිච්ඡේදය 07-අනුකූලතා වාර්තාව

අංකය.	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
01	**පහත දැක්වෙන මූල්‍ය ප්‍රකාශන /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
02	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මූල්‍ය රෙගුලාසි 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවාත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛනය/ පුද්ගලික පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළු මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය.	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛණය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූල්‍ය රෙගුලාසි 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	එක් එක් ගනුදෙනුව නිලධාරීන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක හරහා සිදුවන ආකාරයෙන් බලතල අභිනියෝජනය කරනු ලැබ තිබේ.	අනුකූල වේ		
3.4	රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කරමින් 2014.05.11 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 171/2004 ප්‍රකාරව ගණකාධිකාරී විසින් පාලනයන්ට අනුකූලව කටයුතු කිරීම.	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වීම	පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හා අ.වි.අංශයක් ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත.
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය.	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මූල්‍ය රෙගුලාසි 134(2) DMA/1-2019 අනුව විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සකස් කර තිබීම.	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වීම	පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හා අ.වි.අංශයක් ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත.
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ		
6.3	2018 අංක 19 දරන ජාතික විගනණ පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම .	අනුකූල නොවේ		
6.4	මූල්‍ය රෙගුලාසි 134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල සියලු පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ		
7	**විගණන හා කළමනාකරණ කමිටුව**			
7.1	කළමනාකරණ ගිණුම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ 1-2019 ප්‍රකාරව වසර තුළ අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් හතරක් පවත්වා තිබීම.	අනුකූල වේ		

අංකය.	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
8	**වත්කම් කළමනාකරණය**			
8.1	වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 හි 07 වන ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම හා අපහරණය පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජෙනරාල්ගේ කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත කී චක්‍රලේඛයේ 13වන ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස සුදුසු සම්බන්ධීකරණ නිලධාරියකු පත් කර තිබීම හා එසේ නම් කරනු ලැබූ නිලධාරියාගේ විස්තර කොම්ප්ට්‍රොලර් ජෙනරාල්ගේ කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණය නියමිත දිනට පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	9 නිශ්චිතව දක්වා ඇති කාල සීමාවන් තුළ ඉටු කර තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මුල්‍ය රෙගුලාසි 772 අනුව සිදුකර තිබීම.	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කර නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 6කට වඩා අඩු කාලයක් තුළ අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය.	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍යා තීරණ, ක්‍රියාමාර්ග
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මුල්‍ය රෙගුලාසි 103, 104, 109 සහ 110 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 අනුව වාහනවල ඉන්ධන දහනය නැවත පරීක්ෂා කර තිබීම	අනුකූල නොවේ	ඉන්ධන බෙදා හැරීම සීමිත වීම නිසා ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කිරීමට නොහැකි විය.	මේ වන විට ධාවනයට සුදුසු වාහන සියල්ලම ඉන්ධන පරික්ෂාව කර ඇත.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව කල්බදු වාහනවල ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම.	අදාල නොවේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පිළියෙල කර නොතිබුණි.	මේ වන විට නියමිත දිනට පිළියෙළ කරනු ලැබේ.
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශනවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කිරීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මූල්‍ය රෙගුලාසි 94(1) අනුව බැරකම්වලට එළඹීම වසර අවසානයේදී ඉතිරිව පැවැති ප්‍රතිපාදන ඉක්මවා නොයාම.	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		

අංකය.	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	නිරවුල් කිරීමට කටයුතු කරමින් සිටී	ස්ථාන මාරු වී මාස තුනක් තුල ණය අයකර ගැනීමට කටයුතු කිරීම
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මූල්‍ය රෙගුලාසි 571 අනුව ක්‍රියාමාර්ග ගෙන තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මූල්‍ය රෙගුලාසි 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන්වී මාසයක් ඇතුළත නිරාකරණය කර තිබීම.	අනුකූල වේ		
14.3	මූල්‍ය රෙගුලාසි 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකර තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායම් ගිණුමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මූල්‍ය රෙගුලාසි 176 ප්‍රකාරව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ		

අංකය.	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති අංක 04/2017 චක්‍රලේඛය ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා මහජනතාව වෙත ලබා දී තිබීම සහ වෙඩ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා රාජ්‍ය අධිකාරියක් ලෙස ආයතනය පිළිබඳ මහජනතාවගේ චෝදනා/ ප්‍රශංසා පළ කිරීම සඳහා පහසුකම් සැපයීමට ක්‍රියා මාර්ග ගෙන තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 සහ 10 වගන්ති ප්‍රකාරව අර්ධ වාර්ෂික හා වාර්ෂික වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ අංක 05/2008 සහ අංක 05/2008 (1) චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තියක්/ පුරවැසි සේවාදායක ප්‍රඥප්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තියක්/ පුරවැසි සේවාදායක ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම් ඇගයීම පිණිස ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර තිබීම.	අනුකූල වේ		

අංකය.	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 02හි දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් සකස් කර තිබීම.	අනුකූල නොවේ		
19.2	ඉහත කී මානව සම්පත් සැලැස්මේ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු අවම පුහුණු අවස්ථා සහතික කර තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත කී චක්‍රලේඛයේ ඇමුණුම 01 හි ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම .	අනුකූල වේ		
19.4	ඉහත කී චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කර පවරා තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		